සිළුමිණ

# රසඳුන

කලා ලොව රස කලස

2023 පෙබරවාරි 5



පිටුව 10

## මිල කරන්න බැරි තරම් වටිනවා
## මට ලැබෙන ආදරය

සුමිරාන් ධනංජය

පිටුව 04-05

## මම කරකාරෙට ගත්තේ
## මගෙ සෙකට්‍රිව

අකිල ධනුද්දර

පිටුව 08-09

## රියැලිටි වලින් බිහිවෙන ළමයි කියන්නේ
## ආදර විරහ ගීත

රුවන් ශ්‍රීලාල් දල්පදාදු

උපේඛා රවිහාරි

ඡායාරූපය
වාසල බණ්ඩාර



රංගනය කියන්නේ මගේ හිතකවත් තිබුණේ නැති දෙයක්



# මට ආදරය දැන්මම ඕන නෑ

► නාමලී ගමගේ

"භාග හඳ පායා ආපු දාට
බට ලී ගී ගයන රෑක
කඩුපුල් මල් හොරෙන් ඇහැරනා
ඇස් අස්සෙන් සොකරි නටවනා"

**සතියේ දිනවල දෙරණ නාළිකාවේ විකාශය වන ඉස්කෝලේ ටෙලි නාට්‍යයට නිර්මාණය කළ "භාග හඳ පායා ආපු දාට..." ගීය මේ දිනවල ජනප්‍රියත්වයේ ඉහළින්ම වැජඹෙන ගීතයක්. එහි ළයාන්විත ගායනය නිසල් සත්සරගේ. ඉස්කෝලේ ටෙලි නාට්‍යයේ දුලාන්ගේ චරිතයට පණ පොවමින් රංගනයට පිවිසෙන ඔහු කලාවට පිවිසෙන්නේ ගායකයකු ලෙසින්. ගායනයට වගේම රංගනයටත් එක සේ දස්කම් දක්වන ඔහු සමඟයි අද අපේ කතාබහ.**

**●නිසල් කියනවට වඩා දුලාන් කිවුවම නේද ගොඩක් අය ඔබව දන්නේ?**

ඇත්තටම ඔව්. ඒක නම් පුදුම හැඟීමක්. මට කියන්න වචන එන්නෙත් නෑ. ප්‍රේක්ෂකයන්ගෙන් ලැබෙන මේ ආදරය. ඒක පුදුම සතුටක්. ඉස්කෝලේ ටෙලි නාට්‍යයේ දුලාන්ට ගොඩාක් හොඳ ප්‍රතිචාර ලැබෙනවා.

**●දුලාන්, අනගි කියන්නේ එකම පන්තියේ හොඳම යාළුවෝ වුණත් එතැන පුංචි ප්‍රේමයකුත් තියෙනවා. කොහොමද ඒ ගැන ඔබට ලැබෙන ප්‍රතිචාර?**

පාසල් ප්‍රේමයත් බොහෝ දෙනෙක් අතරේ තියෙන දෙයක්. ඒක ඉතින් එක එක්කෙනා දකින විදිහ තමයි වෙනස්. මේ නාට්‍යයේ එහෙම ලොකුවටම ප්‍රේමයක් අඟවන්නෙ නැති නිසා බැණලා ප්‍රතිචාර ලැබිලා නම් නැහැ. හැමෝගෙන්ම හොඳ ප්‍රතිචාර තමයි දැනට ලැබිලා තියෙන්නේ.

**●රියැලිටි සංගීත වැඩසටහනක් ඔස්සේ ගායකයෙක් ලෙස කරළියට ආ ඔබ දැන් බොහෝ දෙනා හඳුනන්නේ රංගන ශිල්පියෙක් විදිහට. කොහොම ද ඒක සිද්ධ වෙන්නේ?**

මං දෙරණ ඩ්‍රීම් ස්ටාර් සීසන් 9ට තමයි සම්බන්ධ වුණේ. ඊටත් කලින් මං උසස් පෙළ කරද්දී අම්මා අයදුම් පත්‍රයක් දාලා තිබුණා. ඒත් උසස් පෙළ විභාග වැඩත් එක්ක මට හිතුණා දෙකක් කරගන්න බැරි වේවි කියලා. ඒ නිසා සම්බන්ධ වෙන්න බැරි වුණා. ඊට පස්සේ උසස් පෙළ ඉවර වෙලා ඩ්‍රීම් ස්ටාර් සීසන් 9ට සම්බන්ධ වුණා. මගේ තාත්තත් සංගීතයට සම්බන්ධ කෙනෙක්. එයාගෙන් ලොකු සහායක් ලැබුණා. ගොඩක් දුර ආවා. ඒක ඉවර වෙනවත් එක්කම තමයි මට ඉස්කෝලේ නාට්‍යය එක්ක සම්බන්ධ වෙන්න ලැබුණේ. රාධිකා ක්‍රිෂාන්ති අක්කාගේ මාර්ගයෙන් තමයි ඒ අවස්ථාව ලැබුණේ. එයා මට කිව්වා අලුත් නාට්‍යයකට ළමයි 5 දෙනෙක් හොයනවා. ඔයත් ගිහින් බලන්න කියලා. ඒකෙන් මං තේරුණා. රංගනය කියන්නේ මගේ හිතකවත් තිබුණෙ නැති දෙයක්. ඒත් දැන් මට හිතෙනවා ඒක මගේ වාසනාවකට ලැබුණු දෙයක් කියලා. ඊට පස්සේ පෝය නාට්‍ය කීපයකටත් සම්බන්ධ වුණා.

**●මුලින්ම කැමරාවට මුහුණ දෙද්දි කොහොම ද ඒ අත්දැකීම?**

ඒක නම් කවදාවත් අමතක වෙන්නෑ. මුලින්ම තිබුණේ අනගිව බයිසිකලේ තියාගෙන යන සීන් එකක්. කවදාවත් කරපු නැති දෙයක් නිසා සමහර තැන්වලදී ලොක් වුණා. ඩයලොග් කියවුණෙත් නෑ. එහෙම අසරණ වුණ අවස්ථාත් තිබුණා. පස්සෙ පස්සෙ හරි ගියා. මං රංගනය ගැන කිසිම දෙයක් දැනගෙන හිටියෙ නෑ. අඩුම ගාණේ ඉස්කෝලේ යන කාලේවත් කිසිම දෙයකට සම්බන්ධ වෙලා තිබුණේ නෑ. මුලින්ම ස්ක්‍රීන් ටෙස්ට් එකක් තිබුණා. පස්සේ රිහර්සල් තිබුණේ. ඉස්කෝලේ අධ්‍යක්ෂ දිලූක ගුණතිලක අයියා ඇතුළු කණ්ඩායම ලොකු සහායක් දුන්නා. ඒක මගේ පළවෙනි රංගන අත්දැකීම. පළවෙනි එකේදිම හමුවුණු කණ්ඩායම හරිම හොඳයි. ඒ වගේම ලක්සිරි සර් අපිව වර්ක්ෂොප්වලට සම්බන්ධ කළා. ප්‍රවීණයන්ගෙනුත් ලොකු සහායක් ලැබුණා.

**●නිසල් සත්සර කියන ගායකයාට මොකද වුණේ?**

මං පොඩි කාලෙ ඉඳන්ම සංගීතයටයි ගොඩක් ආස කළේ. රංගනය මට අහම්බෙන් ලැබුණු දෙයක්. දෙකටම එක සමානව ප්‍රතිචාර ලැබෙනවා. ඒත් මම පෞද්ගලිකව වඩාත් කැමති මා තුළ ඉන්න ගායකයාට. ඉදිරියේ දී දෙකම සමබරව කරගෙන යන්න උත්සාහ කරනවා.

**●දුලාන්ට අනගි ඉන්නවා වගේ නිසල්ටත් ඉන්නව ද ඒ වගේ කෙනෙක්?**

නැහැ. මං හිතන්නේ ආදරය මට දැන්ම ඕන නෑ. ඒකට ඉස්සරහට කාලයක් ඒවි. ඒකට මේ කාලෙ නෙවෙයි කියලා මං හිතනවා.

**●නිසල් ඉදිරියේ දී නව නිර්මාණවලින් දැකගන්න ලැබේවිද? මොනවද ඉදිරි සැලසුම්?**

දැනට මං ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 4 වැනි වසරේ සිසුවෙක්. ඉස්කෝලේ නාට්‍යයේ කටයුතුයි විශ්වවිද්‍යාල කටයුතුයි එක්ක අලුත් වැඩකට අතගහන්න අමාරුයි. දැනට මගේ සින්දු තුනක් කරලා තියෙනවා. ඉස්කෝලේ නාට්‍යයේ සින්දු දෙකයි ශෘංගාරේ කියන මගේම සින්දුවයි දැනට රිලීස් වෙලා තියෙනවා. ඉස්කෝලේ සඳහා නිර්මාණය වුණු 'ඇස් අස්සෙන් සොකරි නටවනා' ගීතය ගොඩක් ජනප්‍රිය වුණා. අදටත් ඒ ජනප්‍රියත්වය නොවෙනස්ව තියෙනවා. උපාධියේ වැඩකටයුතු කරගෙන අනිවාර්යයෙන් ඉදිරියේ දී නව නිර්මාණ කිහිපයක් කරන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා.



**මම පෞද්ගලිකව වඩාත් කැමති මා තුළ ඉන්න ගායකයාට**

සිළුමිණ, රසඳුන
ලේක්හවුස්,
කොළඹ 10.
www.silumina.lk/rasanduna

සිළුමිණ
රසඳුන
කලා ලොව රස කලස
රසඳුන ආරම්භය : 1996 නොවැම්බර් 03

● දැන්වීම් කළමනාකරු : 011 242 9351 / Silumina.advt@lakehouse.lk

● දුරකථන : 011 242 9267
011 242 9429
● ඊ මේල් : editor.silumina@lakehouse.lk
● ෆැක්ස් : 011 242 9260

# පරණ ලිහිණිට ආදරේ කරන පිරිස තාමත් මාව පිළිගන්න සූදානම් නැහැ

▶ නාමලී ගමගේ

**ටෙලි නිර්මාණයක රංගන ශිල්පියකු හෝ ශිල්පිනියක එහි නිමාවට පෙර හදිසියේ ඉන් ඉවත්වීමෙන් එම ටෙලි නිර්මාණයට විශාල හානියක් වන බව අමුතුවෙන් කිව යුතු නොවේ. ප්‍රේක්ෂකයා ආදරයෙන් වැලඳගත් තමාගේම කෙනෙකු මෙන් සිතින් බදාගත් චරිතයක් එකවරම නැතිවීම ප්‍රේක්ෂක සිත් ව්‍යාකූලත්වයට පත්කරන්නකි. දෙවෙනි ඉනිම ටෙලි නාට්‍යයේ ලිහිණිගේ චරිතය ද නිර්මාණයට එලෙස ජීවයක් දුන් චරිතයකි. ලිහිණිට පණ පෙවූ රංගන ශිල්පිනිය හදිසියේ ඉවත්වීමෙන් ඒ චරිතයට ආදේශ වෙමින් ඒ අභියෝගය පිළිගන්නට සිදුවූයේ ඇයටයි. ඇය නවක රංගන ශිල්පිනියක වන උපේඛා රවිහාරී රණසිංහය.**





මං ගොඩක් උත්සාහ කළා ලිහිණිට සාධාරණයක් කරන්න

**●ලිහිණිට ලැබෙන ප්‍රතිචාර කොහොම ද උපේඛා?**

ප්‍රතිචාර පොසිටිව් නෙගටිව් දෙකම තියෙනවා. පරණ ලිහිණිට ආදරේ කරන පිරිස තාමත් මාව පිළිගන්න සූදානම් නැහැ. ඒත් මං වටේ ඉන්න මගේ නෑදෑයෝ යාළුවෝ ඇතුළු පිරිසක් මට හොඳ ප්‍රතිචාර දක්වනවා.

**●ලැබෙන නෙගටිව් ප්‍රතිචාරවල ඔයාට බැණපු ඒවත් ඇති නේද?**

සමහරු මට බැණලත් තිබුණා. මුලින් මුලින් මං ඒ කමෙන්ට් බැලුවා. පස්සෙ බලන්නේ නැතුව හිටියා. මේක ලංකාවනේ. සමහරුන්ට බණිනවා. සමහරුන්ට හොඳ කියනවා. ඒ වගේ දෙගොල්ලක් ඉන්න ඕන. නැත්නම් සමතුලිතතාවක් නැනේ.

**●ලිහිණී කියන්නේ දෙවෙනි ඉනිම ටෙලි නාට්‍යයේ ප්‍රබල චරිතයක්. හදිසියේම ඒ වගේ චරිතයක පුරප්පාඩුවකට ආරාධනා ලැබුණම බයක් හිතුණෙ නැද්ද?**

ලිහිණි කියන්නේ මේ නිර්මාණය පුරාම දුවන චරිතයක්. ඒ වගේම ගොඩක් ප්‍රේක්ෂක ප්‍රතිචාර ලබපු චරිතයක්. ප්‍රේක්ෂකයන් හුරුවෙලා හිටියේ පරණ ලිහිණිගෙ රූපෙට වගේම රංගනයට. හදිසියේම වුණු මේ වෙනස ඔවුන්ටත් ගැටලුවක් වෙන්න ඇති. මේක මගේ පළමු රංගන අත්දැකීම. මං රංගනය හදාරපු කෙනෙකුත් නොවෙයි. මටත් බයක් දැනුණා.





මේක කොහොමද කරන්නෙ, මොන වගේ ප්‍රතිචාරයක් ලැබෙයි ද කියලා. මං උත්සාහ කළා උපරිමයෙන්ම කරන්න. තාමත් උත්සාහ කරනවා ඒ චරිතය හොඳින් කරන්න.

**●උපේඛාට මේ අවස්ථාව ලැබෙන්නෙ කොහොමද?**

2021 ටීවී දෙරණ අවුරුදු කුමරිය තරගයේ තුන්වැනි ස්ථානය ලැබුණෙ මට. සාමාන්‍යයෙන් දෙරණ ඔවුන්ගේ වැඩසටහන්වල ජයග්‍රාහකයො කවදාවත් අමතක කළේ නෑ. මටත් මේ ලැබුණෙ එවන් අවස්ථාවක්. දෙරණ වැඩසටහන් නිෂ්පාදිකාවක් වන සුබා අක්කයි දෙරණ උප සභාපති ලක්සිරි සර් නිසා තමයි මේ අවස්ථාව මට ලැබුණේ.

**●උපේඛා හිතනවද ලිහිණී තුළ ඔබ සාර්ථකයි කියලා?**

හැමදාම මං ඉන්න ටික නැවත නැවත බලනවා. එතැනදී මට හිතෙනවා මට තව හොඳට කරන්න පුළුවන් කියලා. ඊළඟ දවසේ ෂූටින්වලදී මං තවත් උත්සාහ කරලා උපරිමයෙන් කරනවා. මං ගොඩක් උත්සාහ කළා ලිහිණිට සාධාරණයක් කරන්න. ඒක ටිකක් අමාරු වැඩක්. තවමත් උත්සාහ කරනවා.

**●උපේඛාට හිතුණෙ නැද්ද තව කෙනෙකුගේ චරිතයකට අතරමැදදි සම්බන්ධ වෙද්දි තමන් තමන්ටම කරගන්නෙ ආසාධාරණයක් කියලා?**

ජනප්‍රිය කෙනෙක් දීර්ඝ කාලයක් කළ චරිතයක් කරන්න ලැබීමම අභියෝගයක්

ලැබුණු අවස්ථාව ගැන මට සතුටුයි. මං හිතන විදිහට මේක මගේ වාසනාවට ලැබුණු දෙයක්. මේ මගේ පළමු නිර්මාණය. ඒ වගේම වෙන ජනප්‍රිය කෙනෙක් දීර්ඝ කාලයක් තිස්සේ කළ චරිතයක් කරන්න ලැබීමම අභියෝගයක් කියලයි මට හිතෙන්නේ. ඒ නිසා මම හිතෙන්නෙ නැහැ මට අසාධාරණයක් වුණා කියලා.


**●ගෙදරින් ඔබේ රංගනයට ලැබෙන සහාය ගැන කිවුවොත්?**

ගෙදරින් මට ලොකු සහායක් ලැබෙනවා. පවුලේ එකම ළමයා මං. අම්මා තමයි මට ගොඩක්ම උදවු කරන්නේ. මගේ හෙවණැල්ල වගේ පස්සෙන්ම ඉන්නේ මගේ අම්මා.

**●ආදරවන්තයා ඔබේ රංගනයට තහංචි දාන්නෙ නැද්ද?**

නැහැ. එහෙම කිසිම ප්‍රශ්නයක් නැහැ. ඔහුත් මගේ රංගන කටයුතුවලට උදවු කරනවා.





# අප්පච්චි
## හොස්පිට්ල් එකේ ඩොක්ටර්ස්ලා, නර්ස්ලා හැමෝටම කියලා වෙච්ච හැම දෙයක්ම පොතක් ලියනවා කියලා, අප්පච්චිගේ ඒ කතාව පොතකින් එළියට එයි
## හැමෝම ආදරේ කරන ජැක්සන් ගැන පුතු ධනුද්දර කියූ කතාව

# මම කරකාරෙට ගත්තේ මගේ සෙකට්‍රිව

▶ **හර්ෂණී වීරරත්න**

**ඒ ආදරණීය අම්මයි අප්පච්චියි නොකරපු කලා කටයුත්තක් නැති නිසා තමන්ගේ ලොකු පුතණුන්වත් කලාවට සම්බන්ධ වෙනවට හරිම කැමැත්තෙන් හිටියා. ඒ පවුලම කලාකාමි පවුලක්. ඒ වෙන කවුරුත් නෙමෙයි සුවහසක් ආදරේ ලබන ඇන්තනී පවුල. ඒ පවුලේ දෙවැනි පුතා විදිහට උපත ලබන අකිල ධනුද්දර කලා කටයුත්තකට සම්බන්ධ වෙන්නේ අවුරුදු විසි තුනේදී. ඒකට හේතුව අප්පච්චි ආසම අශ්වයෙක් ඇති කරන්න නිසා ඒ අශ්වයා අරන් දෙන්න ඕන කියලා අකිල ව්‍යාපාර පැත්තට යොමු වෙනවා. ඒ ආදරණීය කතා රසඳුන පිටු අතරට ගෙන එන්න අකිලව අපේ කතාබහට එකතු කර ගත්තා. මේ ආදරණීය දුවණියකට ආදරණීය තාත්තා කෙනෙක් වූ ඔහු ගැනයි.**

**●අකිල අප්පච්චිට තිබ්බ ආදරේට පොඩි කාලේ ඉඳලා බිස්නස් කරා නේද ඕස්ට්‍රේලියා වෙන් ඇපල් වත්තකුයි අශ්වයකුයි අරන් දෙන්න ..?**

අප්පච්චි පුංචි කාලේ ඉඳලා කිව්වා ඔයා ලොකු වුණාම මට ඇපල් වත්තක් අරන් දෙන්න කියලා . ඒ වගේම අප්පච්චි අශ්වයෝ පදින්න හරි ආසයි. ඉතිං මට තේරෙන දවසේ ඉඳලා මම අප්පච්චිට කිව්ව දෙයක් තමයි රඟපාලා ඇපල් වතු අශ්වයෝ ගන්න බැහැ. ඒ නිසා මම බිස්නස් කරලා සල්ලි හොයලා අප්පච්චිගේ ආශාව ඉෂ්ට කරන්නම් කියලා. මම පුංචි කාලේ ඉඳලා මාළු විකුණුවා. විකුණලා සල්ලි ගත්තා. ඔය එක එක දේවල් කරා. ඒවා ජීවිතේ ට සුන්දර අත්දැකීම් එකතු කරා. මට තවම මගේ අප්පච්චිගේ ඒ ආශාව ඉෂ්ට කරන්න බැරි වුණා. අප්පච්චි අන්තිමට කිව්වා උඹේ ඇපල් වත්ත එපා රඟපාන්න පලයං කියලා.

**●අම්මයි අප්පච්චියි මොනවා කිව්වත් රඟපාන්නේ නැහැ කැමරාවක් ඉදිරියට එන්නේ නැහැ කියලා හිටපු අකිල දැන් වැඩ ගොඩක් කරන කෙනෙක් වෙලා..?**

ඒකනේ. පුංචි කාලේ ඉඳලා අක්කයි මල්ලියි හරි ප්‍රසිද්ධයි. ජැකාගේ කුමාරිගේ දරුවෝ දෙන්නෙක් ඉන්නේ කියලා හිතපු අය හිටියා. මේ ගොල්ලන්ට නිදහසේ පාරේවත් යන්න බැහැ . කිසිම අත්වැරුද්දක් කරන්න බැහැ. ඉතිං පරිස්සමින් ජීවත් වෙන්න ඕන. කවුරුත් දන්නේ නැති නිසා මාව මම නිදහසේ පාරේ බැහැලා ගියා. හිතුණු විදිහට නිදහසේ ජීවත් වුණා. ඔය හේතු නිසා තමයි මට මගේ පාඩුවේ වැඩක් කරගෙන ඉන්න ඕන වුණේ. නමුත් මට ඇනුමක් තාලෙට ගියත් අම්මා අප්පච්චි සතුටු වුණා. මම වැරදිලා සිංදුවක් කියන්න ගියා කියලා. ඒ දෙන්නා ආස වුණා මම රඟපානවට. සිංදු කියනවට. අප්පච්චි කිව්වා හොඳ නිර්මාණයක් කළොත් මොකද කියලා. මම සල්ලි එකතු කරලා ඇපල් වත්තක් අරන් දෙනවට වඩා රඟපාන්න යන එක හොඳයි කියලා හිතුවා අන්තිමට. ඊට පස්සේ තමයි රොමේෂ් සුගතපාල කියන දිගු දෑස දුටුවාම කියන ගීතයේ විෂුවල් එකට සම්බන්ධ වෙන්නේ. ගෙදරට ඇවිත් ඒකට ආරාධනා කළාම අම්මයි අප්පච්චියි හරියට සතුටු වුණා. මම බැහැ කිව්වා. ඊට පස්සේ සම්බන්ධ වුණා ඒකට. ඒ වගේම ඒ කාලේ ඒක හිට් එකක් වුණා. ඊට පස්සේ නිර්මාණවලට ආරාධනා ආවා. මමත් සම්බන්ධ වුණා වැඩේ අල්ලලා ගියා.

**●දැන් නිර්මාණයක් අවසන් වෙද්දී තව නිර්මාණයකින් දකින්න ලැබෙනවා ..?**

ඔව්. මේ දවස්වලත් ශලනි තාරකා එක්ක රඟපාන චිත්‍රපටයක වැඩ අවසන් කළා. පහුගිය අවුරුදු තුනට චිත්‍රපට අටක් කළා. ධනංජය සිරිවර්ධන අයියා අධ්‍යක්ෂණය කරන නාට්‍යක් ළඟදිම විකාශනය වෙයි. ඊට අමතරව හිරු නාළිකාවෙන් ආරාධනාවක් ලැබුණා නර්තන රියැලිටි එකක විනිශ්චය මණ්ඩලයට වාඩි වෙන්න. ඒ කටයුත්තටත් සම්බන්ධ වෙනවා.

**●ඔය කාර්යබහුල ජීවිතේ එක්ක පවුල මඟ හැරිලා නැද්ද ..?**

මාස හයකට වඩා වැඩි කාලයක් මම සම්බන්ධ වෙන්නේ කොළඹ වැඩවලට විතරයි. ඉස්සර එහෙම නැහැ පිට පළාත් වලට ෂූටිං ගිහිං ගෙදර එන්නේ දවස් අට නමයක් හෝ විස්සක් විතර ඉඳලා. දැන් එහෙම නැහැ. හවසට ගෙදර එන්න බලාගෙන තමයි හැම දෙයක්ම භාර ගන්නේ. ඒ නිසා පවුල් ජීවිතේ හෝ බිරිය දුව මිස් වෙලා නැහැ. මට දවසක්වත්. කොළඹ රැඳෙන්න තව හේතුවක් තියෙනවා හොස්පිටල් ගිහිං අප්පච්චිව බලලා එයාට නින්ද යනකල් ඔහේ ආගිය තොරතුරු කතා කරලා එන්නේ. මම ඉන්නේ මහ ගෙදර. අක්කයි මල්ලියි එයාලගේ වගකීම් ඉටු කරද්දී අප්පච්චි වෙනුවෙන් කරන්න මටත් වැඩ තියෙනවා. අපි හැමෝම අප්පච්චිව ඉක්මනින් ගෙදර ගේනකල් බලාගෙන ඉන්නවා. වෛද්‍යවරු අප්පච්චිව සුව කරමින් ඉන්නවා.











**●ජක්සන් ඇත්තනියන් කියන්නේ ඇවිදින පුස්තකාලයක්. එතුමා නැවත නිර්මාණ කටයුත්තකින් දකිනතුරු නොඉවසිල්ලෙන් ඉන්න රසිකයින්ට ඔබ දෙන සුබ පණිවිඩය මොකක්ද...?**

අප්පච්චි ගැන නානාප්‍රකාර දේවල් නිව්ස් වෙලා පළ වෙද්දී ඒ දිහා උත්තර නොබැඳ ඉන්න අපි වග බලාගන්නවා. අප්පච්චි රෝහලේ ඉන්නේ උණක් හෙම්බිරිස්සාවක් හැදිලා නෙමෙයි . සුෂුම්නාව ආශ්‍රිත තත්ත්වයක්. එක එක්කෙනාට එයාලට හිතිච්ච දේ කියන්න ඉඩ හැරලා අපි නිහඬව ඉන්නවා. කියන්න තියෙන්නේ අප්පච්චි හොස්පිටල් එකේ නර්ස්ලා ඩොක්ටර්ස්ලාට කියලා තියෙනවා ඉක්මනින් ඇවිත් එයාට වෙච්ච සියල්ල පොතක් බවට පත් කරනවා කියලා. ඒ කතාව පොතකින් එළියට එයි. අපි අප්පච්චිගේ කතාව කියනවට වඩා අප්පච්චි කියන එක හොඳයි. ඒ වගේම අප්පච්චි නිතරම කිව්වා මම රටට සේවය කරන්න ඕන කියලා. කවදා හරි මගේ මිනිය බලන්න සෙනඟ ගඟක් ආවොත් තමයි මම රටට සේවයක් කරපු මිනිහෙක් වෙන්නේ. නැත්නම් මම නිකම්ම නිකම් මිනිහෙක්. මට නිකම් මිනිහෙක් විදිහට මැරිලා යන්න බැහැ කියලා.

**●පුංචි ද්‍රෝණිට සීයා අප්පච්චි මඟ හැරිලා ඇති ..?**

අපේ පවුලට එකතු වුණු පළවෙනි දරුවා එයා. ඒ නිසා හැමෝම එයාට ආදරේ කළා. අක්කා මල්ලි විවාහ වෙන්න කලින් වැඩ කරලා ගෙදර එන්නේ අපේ අරන්‍යා ඇන්තනීව හොයාගෙන. දැන් එයාට අවුරුදු තුනක් ලැබුවා. දුවට අප්පච්චිව ගොඩක් මඟ ඇරිලා සෙල්ලම් කරන්න නැති නිසා.

**●ආරණ්‍යා නම තැබුවෙත් ඔහු..?**

අප්පච්චි කිව්වේ කෙල්ලට ගෙදර ආරණ්‍යක් වගේ සැනසිල්ලේ ඉන්න තියෙන්න ඕන. එයා ගෙදරට සැනසිල්ල ගෙනෙයි කියලා තමයි ඒ නම තිබ්බේ. මොන සැනසිල්ල ද එයා නිතරම ඉන්නේ හරි කලබලෙන්. ඒ වුණාට ආදරණීය දුවක් එයා. එයාට ආදරේ පිරිලා ලැබෙනවා. ආරණ්‍යා දන්නවා පවුලේ හැමෝම කරන කියන දේ. එයාලා කැමති කෑම බීම කැමති පාට පවා.

**උඹේ ඇපල් වත්ත එපා රඟපාන්න පලයන් කිව්වා..**



**●ජනප්‍රිය නළුවෙක් හා කලා පවුලක පුතෙක් කරකාරෙට ගැනීමත් ජීවත් වීමත් සාමාන්‍ය විදිහට ජීවත් වුණු කෙනෙකුට අසීරු කටයුත්තක් වෙන්න පුළුවන්. කොහොමද බිරිය ..?**

එයාට ආදරේට කියන්නේ එමී කියලා. ඇය ඇමෙන්ඩා ඇන්තනී. මම කරකාරෙට ගත්තේ මගේ සෙකට්‍රිවනේ. කාලයක් දැන හඳුනාගත් එමිව කසාද බැන්ද නිසා කිසිම ප්‍රශ්නයක් නැහැ. අමුතුවෙන් අපේ පවුලට හෝ මට හැඩ ගැහෙන්න අවශ්‍ය වුණේ නැහැ. මාව තේරුම් අරන් ආදරේත් එක්ක පවුල් ජීවිතේ ලස්සනට ගත කරනවා. හැමදාම උදේ පහයි තිහට මම නැගිට්ද්දී එයා උයන කෑම සුවඳ දැනෙන්න ඕන. එයාගේ අතින් උයලා දෙන කෑම එක මට එක දවසක් නැති වුණොත් දවසම ඉවරයි . ඒ නිසා අසනීපයෙන් හිටියත් එමී කවදාවත් අමාරුයි කියලා නිදාගන්නේ නැහැ. සියල්ල හොයලා බලලා හැමදේම කරනවා. එයා නිසා ජීවිතේ ලස්සන වෙලා. කොහොම හරි ඉතිං ගැළපෙන ම කාසාදේ කරගත්තා.

**කියන අයට ඕන දෙයක් කියන්න කියලා අපි නිහඬව ඉන්නවා**

**●අනේ අකිල මම නළුවෙක් බැන්දේ අපරාදේ කියලා නැද්ද ..?**

එහෙම කියන්න හේතුවක් වෙලා නැහැ . කොහේ ගියත් අපි තුන්දෙනා එකට යන්නේ. වැඩිපුර කාලයක් පවුලත් එක්කයි ගත කරන්නේ.



2023 පෙබරවාරි 5

# අද පවතින මේ විදිහට මම තෘප්තිමත් නෑ

▶ අනුෂා රණසිංහ

**සරත් කරුණාරත්න කියන්නේ උසස් පෙළින් පස්සේ ජාතික තරුණ සේවා සභාවේ රංග ශිල්ප ශාලිකාවෙන් රංගනය හදාරා එතැනින් එහාට තමන්ට රඟපාන්න ලැබෙන චරිත ඔස්සේ සහ පොතපත කියවීමෙන් මෙන්ම නාට්‍ය වැඩමුළුවලට සහභාගීවෙමින් රංගනය ගැන අධ්‍යයනය කරමින් මේ කලා ක්ෂේත්‍රය තුළ තම රංග කුසලතාව තමන්ට ලැබෙන නිර්මාණ ඔස්සේ ප්‍රේක්ෂකයන්ට සමීප කරන සොඳුරු රංගන ශිල්පියෙක්. මේ වෙද්දී නම් සරත් වඩාත් ජනප්‍රිය වී තිබෙන්නේ දිවිතුරා හි සමීර ලෙසින්.**



**●මේ දවස් වල මොකද වෙන්නේ**

වේදිකාවට වැඩි ඉඩක් දීලා තියෙන කාලයක්. අලුත් වේදිකා නාට්‍යය දෙකකට සම්බන්ධ වුණා. ඉන් එකක් සුජීව ප්‍රියලාල් අධ්‍යක්ෂණය කරන ලද "සුකිරි බටිල්ලෝ" වේදිකා නාට්‍යය. එහි ප්‍රථම දර්ශන දෙක ජනවාරි 27 සහ 28 ලයනල් වෙන්ට්ඩ් රඟහලේ දී වේදිකා ගත වුණා. එහි මමත්, දුලීකා මාරපන, ලසඳුනි ජයවර්ධන, ජයන්ත මුතුතන්ත්‍රී, සුජීව ප්‍රියලාල් රංගනයෙන් දායක වුණා. ඊට අමතරව චාලක රණසූරියගේ අලුත් ම වේදිකා නාට්‍යය වන "සඳුදා වැටෙන්නේ සිකුරාදාට" හි පෙර පුහුණුවීම් සිදුවෙනවා. එය වේදිකාගත වෙන්නේ පෙබරවාරි 11 මරදාන එල්ෆින්ස්ටන් රඟහලේ දී සවස 3.30ට සහ 6.30ට වේදිකාගත වෙනවා. ඒ එක්කම මම රංගනයෙන් දායක වුණු "බල්ලොත් එක්ක බෑ, චරිතේ හොරු අරන් ,රජා මං වහලා" වගේ නාට්‍යය මේ වෙද්දී දිවයින පුරා වේදිකාවෙන නිසා සති අන්තය වෙන් වෙන්නේ ඒවායෙහි දර්ශනවාරවලට.

**●වේදිකාවේ වැඩ වැඩියි වගේ?**

පසුගිය කාලේ විවිධ අර්බුද හමුවේ වේදිකාවට ඉඩක් ලැබුණේම නැහැ. මේ වෙද්දීත් ආර්ථික අර්බුදය දරුණුවටම තියෙනවා. නමුත් මිනිසුන් රසවින්දනය උදෙසා නාට්‍යය බැලීමට එනවා. ඒ නිසා ඒ එන හැම ප්‍රේක්ෂකයෙක්ටම උපරිම සාධාරණය ඉෂ්ට කරන්න අපි කැපවෙනවා.

**●පුංචි තිරය ගැන කතා කළොත්?**

මේ කාලයේ නම් හිරු නාළිකාවේ විකාශය වන දිවිතුරා නාට්‍යයෙන් පමණයි මම ප්‍රේක්ෂකයන් අතරට එන්නේ. එහි ෂූටින් තව කෙරීගෙන යනවා. ඒ එක්කම මධුෂාන් හත්ලහවත්ත අලුත් නාට්‍යයක් කරනවා. එහි ෂූටින් පටන් ගත්තා.

**●කොහොමද දිවිතුරා හි සමීරට ලැබෙන ප්‍රතිචාර**

මේ දවස් වල වැඩිම ප්‍රතිචාර තියෙන්නේ සමීරට තමයි. ගොඩක් තැන්වලදී මට සමීර කියලා කතා කරන්නේ. ටීනාව හම්බුනාම කෝ සමීර කියලා අහනවලු. ඒ වගේම තමයි මාව හමුවුණාමත් ප්‍රේක්ෂකයන් අහන්නේ කෝ ටීනා කියලා. දිවිතුරා කියන්නේ වෙනස් විදියේ නාට්‍යයක්. සාමාන්‍යය පෙම් පලහිලව්වකට එහා ගිය කතාවක් නිසා ගොඩක් අය කැමති නාට්‍යයක් බව ලැබෙන ප්‍රේක්ෂක ප්‍රතිචාර වලින් තේරෙනවා.



ගොඩක් තැන්වලදී මට සමීර කියලා කතා කරන්නේ

**●මෙගා නාට්‍යය වලින් ඇතැම් ශිල්පීන් කාලයක් යද්දී ඉවත් වෙනවා, ඔබත් එහෙම වෙයි ද?**

පුළුවන් තරම් කල් ඉන්නවා. නාට්‍යයේ ගුණාත්මක භාවය අඩු වුණොත් හැර මම නම් අයින් වෙන්නේ නැහැ. මම භාර ගත්ත වැඩක් ඉවර කරනවා. නමුත් පටන් ගන්නකොට තියෙන ගුණාත්මක කාරණා නැති වෙන්න පටන් ගත්තොත් නම් මම රැඳෙන්නේ නැහැ. දිවිතුරා නාට්‍යය නම් නොයෙක් බාධක ප්‍රශ්න මැද පවා අධ්‍යක්ෂ චාමර ජයවීර, නිශාන්ත සහ වසන්ත ඇතුළු අනෙකුත් කණ්ඩායමේ සියලුම දෙනාගේ කැපවීම මත ගුණාත්මක භාවය රැකගෙන තවමත් ෂූටින් කෙරෙන නාට්‍යයක්.

**●මේ කාලය තුළ කළ කි දේවල් ගැන තෘප්තිමත් ද?**

මම ක්ෂේත්‍රයට ඇවිත් දැන් වසර 20 ක් සම්පූර්ණයි.. වේදිකාවට තමයි මම මුලසිටම අදටත් ගොඩක්ම ආසක්ත වෙලා ඉන්නේ. එතැනදී මම පර්යේෂණාත්මක නාට්‍යය ගණනාවක වැඩ කළා. මේ වෙද්දී චාමික හත්ලහවත්ත සමඟ දීර්ඝ කාලීනව වැඩ කරනවා. ඒ තුළින් මම මගේ රංගන ජීවිතේට දේවල් ලබා ගනිමින් ඉන්නවා. සිනමාවේ නම් මම ගොඩක් වැඩ කරලා නැහැ. චිත්‍රපට තුනක වගේ තමයි මේ වෙනකොට වැඩ කරලා තියෙන්නේ. පුංචි තිරයේ නම් නිර්මාණ නම් ගොඩක වැඩ කරලා තියෙනවා. නමුත් නළුවෙක් විදියට මම තෘප්තිමත් ද ඇහුවොත් ටෙලි නාට්‍යය කලාවේ අද තියෙන නිර්මාණ වල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් යම් යම් ප්‍රශ්නකාරී තැන් තියෙනවා. ඒ නිසා මම වෘත්තීය රංගන ශිල්පියෙක් විදියට මේ ක්ෂේත්‍රයේ යම් අසමතුලිතතාවයක් දකිනවා. ඒ නිසා නිර්මාණවල ගුණාත්මකභාවයට ගොඩක් හානි වෙලා තියෙනවා. අපි මේ ක්ෂේත්‍රයට එන්න ආස වෙන කාලේ අපි දැක්ක ටෙලි නිර්මාණ වල තිබ්බ රසය අද නැහැ. ඒකට හේතුව ආර්ථික ප්‍රශ්නයක්. මොකද ඉතා කුඩා මුදලකට නාට්‍යයක් ගන්න වෙන්නේ ඒ නිසා අඩු මුදලින් නාට්‍යයක් නිෂ්පාදනය කරන්න කියලා නිෂ්පාදකතුමාට කිව්වම ඒ මුදල ඇතුළේ කරන්න පුළුවන් හරිය තමයි අද දකින්නේ. මීට කලින් දඬුබස්නාමානය වගේ නාට්‍යයකට ගෙවපු ගානෙන් බාගයක්වත් අද ගෙවන්නේ නැහැ. සියලු දේවල් වල මිල ඉහළ යද්දී මෙහි විතරක් මිල පහළට ගිහිල්ලා. ඒකට හේතු මම දන්නේ නැහැ. නමුත් ඒ හින්දම අද පවතින මේ විදියට මම තෘප්තිමත් නැහැ.

**●ලැබෙන ප්‍රේක්ෂක ආදරේ සහ ප්‍රතිචාර ගැන මොකද හිතෙන්නේ?**

ඇත්තටම ඒ ආදරේ තමයි මාව ජීවත් කරවන්නේ. මට සමාජයෙන් ප්‍රේක්ෂකයන්ගෙන් ලැබෙන ප්‍රතිචාර වලට සහ ඒ අය මාව හඳුනා ගැනීම ගැන මම මාර විදියට සතුටු වෙනවා. නළුවෙක් විදියට දැකලා මා එක්ක කතා කරලා යන අය යන්නේ ඔයා හොඳ මනුස්සයෙක් කියලා. මම දන්නේ නැහැ ඇයි එහෙම කියන්නේ කියලා. නමුත් මම ඒකට හරි කැමතියි. මම දන්නවා ගොඩක් ප්‍රේක්ෂකයන් මට ආදරෙයි කියලා. ඒ ආදරේ මම නිහතමානීව පිළිගන්නවා.

**●පෞද්ගලික ජීවිතේ ගැන කතා කළොත්**

පවුල් ජීවිතේ හොඳයි. මගේ බිරිඳ උවනි චාමිකා ගුණසේකර. එයා පිටපත් රචිකාවක් සහ ගුරුවරියක්. අපිට පැටවු දෙන්නෙක් ඉන්නවා. පුතා මෙත්සර කරුණාරත්න. දුව සාරා කරුණාරත්න. ඉතින් අපි හරි ආදරෙන් ඉන්නවා. ලොකුම ප්‍රශ්නය තියෙන්නේ එයාලට මාව නිතර මුණගැහෙන්නේ නැති එක. මේ දවස් වල විශේෂයෙන් වේදිකා නාට්‍යයත් එක්ක කාර්යබහුල වීම එක්ක ගෙදර රැඳෙන කාලය අඩුයි. ඒ අය ඇහැරිලා ඉන්න වෙලාවේ මම ගෙදරට ගියොත් අහන්නේ තාත්තේ දැන් ආපහු යනවා ද? තාත්තේ අද යනවද වගේ දේවල්. පෙබරවාරි 11 වෙනකම් මේ තත්ත්වය තියෙයි. ඉතින් ඔහොමයි පෞද්ගලික ජීවිතේ ගෙවෙන්නේ.





මම දන්නවා බොහෝ ප්‍රේක්ෂකයන් මට ආදරෙයි කියලා

# බැඳෙන හැම බැඳීමක් තුළම මට දැනුණේ ලොකු දුකක්



හොඳම යාළුවෝ කියලා හිතාගෙන හිටිය අය ළඟ මම හිතන් හිටිය යාළුකමක් තිබුණේ නෑ

▶ අනූෂා රණසිංහ

**පුංචි තිරයෙන් මෙන්ම සිනමාවෙන් ඇය ප්‍රේක්ෂකයන් අතරට එන ගීතිකා රාජපක්ෂ කියන්නේ නව පරපුරේ දක්ෂ රංගන ශිල්පිනියකි.**

**●මේ දවස්වල මොනවද වෙන්නේ?**
රංගනය පැත්තෙන් කාර්යබහුල වෙලා ඉන්න කාලයක් නම් නෙවෙයි. හැබැයි වෙනත් කටයුතු එක්ක කාර්යබහුල වෙලා ඉන්නවා. ඒ වගේම මේ කාලේ පටන් ගන්න නියමිතව වැඩ කිහිපයක් තිබුණා. ඒ දේවල් බොහෝ දුරට පෙබරවාරි වගේ වෙද්දී පටන් ගනී.

**●විකාශය වෙන්න නියමිත නිර්මාණ තියෙනවද?**
එහෙම බැලුවොත් නම් නිර්මාණ සෑහෙන්න ප්‍රමාණයක් තියෙනවා. නිර්මාණ අතරත් යම් තරගයක් තියෙන නිසා වෙලාව එන්නත් ඕනනේ. ඒ නිසා ඒ නිර්මාණ විකාශය වෙද්දී තමයි කතා කරන්න වෙන්නේ.

**●සිනමාව පැත්තෙන් ගත්තොත් කොහොමද?**
අලුත්ම සිනමා නිර්මාණයක් පටන් ගන්නවා. ටෙලි නාට්‍යය ක්ෂේත්‍රයේ ඉන්න නිෂ්පාදකවරයෙක් වන කෙනෙක් සිනමාවට යොමුවෙලා අලුත් නිර්මාණයක් කරන්න යනවා. ඒ නිර්මාණයට මටත් කතා කරලා තියෙනවා.

**●වැඩි කැමැත්ත තියෙන්නේ සිනමාවටද?**
පුංචි තිරය තුළින් තමයි අපිව ප්‍රේක්ෂකයන්ට සමීප වෙන්නේ. නමුත් සිනමාව කියන්නේ ඊට ගොඩක් ඉහළින් තියෙන එකක්. ඇත්තටම දැන් සිනමාවට ආසයි සහ ආදරෙයි.

**●චරිතයක් තෝරා ගනිද්දී මොනවද බලන්නේ?**
ඉස්සර නම් ගොඩක් දේවල් බැලුවා. ගීතිකාගෙන් එහාට ගිය මතකයේ හිටින දෙයක් කරන්න පුළුවන් නිර්මාණයක් ද කියන එක ඉස්සර බැලුවා. හැබැයි දැන් අපි වෘත්තිය මට්ටමෙන් මේ රංගනය කරද්දී දැන් ලොකුවට දේවල් හොයන්න අමාරුයි. තෝරා බේරා ගැනීම කියන එක නැතුවාම නෙවෙයි. නමුත් එක දිගටම එකම විදියේ චරිත කරන්න මම කැමති නැහැ. පහුගිය ටිකේම ලැබුණේ එකම විදියේ ගැමි චරිත. කාලයක් ගැමි චරිතයක් කරන්න ආසාවෙන් හිටියා. දැන් ඇති වෙන්න මට ගැමි චරිත ලැබුණා. ඒකට අකමැති නැහැ. නමුත් මම හාස්‍ය මතුවන චරිතවලට වැඩිය යන්නේ නැහැ. හාස්‍ය කියන එක හොඳයි හැබැයි මම ඒ පැත්තට යොමු වෙන්න කැමැත්තක් නැහැ. හාස්‍ය චරිත උපරිමයෙන් කරන්න පුළුවන් අය ඉන්නවා. මේ කාලේ තෝරා ගැනීම්වලදී හාස්‍ය මතුවන චරිත පමණයි තෝරා නොගන්නේ.

**●ගීතිකාට රංගනය තුළ සීමාවන් තියෙනවද?**
නැහැ. රංගන ශිල්පිනියක් නම් එහෙම සීමාවන් තියෙන්න බැහැනේ. රංගනයට එන කෙනෙක් මැටි පිඩක් වගේ වෙන්න පුළුවන් වෙන්න ඕනේ. ඒ තුළින් ඕනෙම චරිතයක් අඹන්න පුළුවන් වෙන්න ඕනේ. ඒ නිසා සීමාවන් තියා ගන්න බැහැ. හැබැයි පෞද්ගලිකව එක එක සීමාවන් තියා ගන්න පුළුවන්. අපේ රටේ තියෙන දෙයක් තමයි එක චරිතයක් කළොත් දිගටම ලැබෙන්නේ එක හා සමාන චරිත. ඒ නිසා එතනින් මිදිලා වෙන පැත්තකට යොමු වෙන්න අමාරුයි. ඒ නිසාම තමයි මම හාස්‍ය උත්පාදන චරිතවලට පවා යොමුවෙන්න බය.

**●ලැබෙනවා නම් හොඳයි කියලා හිතෙන රඟපාන්න ආසාවෙන් ඉන්න චරිතයක් තියෙනවද?**
මම මෙතෙක් කරලා නැත්තේ රජ කාලේ නිර්මාණ පමණයි. මම ආසාවෙන් ඉන්නවා එවැනි නිර්මාණයක් කරන්න. අනෙකුත් චරිත සියල්ල පාහේ මට ලැබිලා තියෙනවා.

**●රංගන ක්ෂේත්‍රයේ ඉන්න හොඳම මිතුරියන් කවුද?**
පාසල් කාලේ හොඳම යාළුවො දෙන්නෙක් හිටියා. විශ්ව විද්‍යාල කාලේදීත් හොඳම යහළුවන් හිටියා. අපේ සෙට් එකට කියන්නේ දහයේ සෙට් එක කියලා. නමුත් එතන හිටියේ අටයි. ඒ යාළුවො අද වෙද්දී ගොඩක් හොඳ තැන්වල ඉන්නවා. රංගන ක්ෂේත්‍රයට ආවට පස්සේ හොඳම යාළුවො කියලා හිතාගෙන හිටිය අය ළඟ මම හිතන් හිටිය යාළුකමක් තිබුණේ නෑ. ඒ නිසා මට හරි කලකිරීමක් ඇති වුණා. සමහර විට ඕනෙවට වඩා මම ඒ අයව විශ්වාස කරන්න ඇති. එදා ඉඳන් හිටිය යාළුවන්ගෙන් අද වෙනකම් මට ඉන්න

ඕනෙම දෙයක් කියන්න පුළුවන් යාළුවො දෙන්නයි. ඒ ශලනි තාරකා සහ ධනංජී තාරුකා.

**●ආදරේ ගැන ගීතිකා මොකද හිතන්නේ**
ආදරේට මම හරිම බයයි. ආදරේට මම ගොඩක් ආදරණීය කෙනෙක්. ඒ නිසාම ආදරේදී මම ගොඩක් දේවල් බලාපොරොත්තු වෙනවා. ඒ දේවල් බිඳෙන කොට මගේ හිතත් බිඳෙනවා. ඒ හින්දා මම හරි කැමතියි තනියම ඉන්න. මොකද හැම බැඳීමක් ම හරිම වේදනාවක්. මගේ තාත්තා අසනීප වුණා. තාත්තා ගාව මමයි මල්ලියි දෙන්නම හිටියා. මේ වෙද්දී මගේ ලෝකයේ වෙන කවුරුත් නැහැ ඉන්නේ මවුපියන් පමණයි. මේ වෙද්දී මගේ සහෝදරියන් දෙන්නම විවාහ වෙලා බබාලා ඉන්නවා. ඒ අයගේ ජීවිත මගේම ජීවිත වගේ. බැඳෙන හැම බැඳීමක් තුළම මට දැනුණේ ලොකු දුකක්. බැඳීම් අඩු වෙද්දී මට දුක් වෙන්න හේතුවක් නැහැ. ඒ නිසා මම දුක් වෙන්න හේතු හදාගන්නේ නැතුව පාඩුවේ ජීවත් වෙනවා.

**●මෙතෙක් ආව ගමන් මඟ ගැන තෘප්තිමත් ද?**
බොහොම හිමින් ආව ගමනක් මට තියෙන්නේ. කාලයක් නිතර පුංචි තිරයේ දකින්න ලැබෙන චරිතයක් වෙලා හිටියා. ඒ වගේම මේ මැද කාලය තුළ යමක් කරන්න ට හැකි හොඳ බර චරිත මට ලැබුණා. ඒ එක්කම මම සිනමාවට ආවා. ඒ නිසා මම ආව ගමන ගැන සතුටුයි. එක පාරට ආව ගමනක් නෙවෙයි මට තියෙන්නේ. මම මේ රංගනයට හරි ආදරෙයි. ඒ ආදරේ එක්ක බොහොම ගෞරවයෙන් මම මගේ ගමන යනවා. ඒ නිසා මේ ආව ගමන ගැන සතුටක් මිස දුක් වෙන්න දෙයක් නැහැ.





හැම බැඳීමක් ම හරිම වේදනාවක් ඒ නිසා මම කැමතියි තනියම ඉන්න



# මට ලැබෙන ආදරය මිල කරන්න බැරි තරම් වටිනවා

► සඳුනි අරුමප්පෙරුමාච්චි

**කුරුළුට අභිමන්ව නැවත හිමි වෙයිද? මේ දිනවල නීල පබළු ප්‍රේක්ෂකයන්ගේ බලාපොරොත්තුවක් තමයි එය. ඉතින් රසඳුන අපි හිතුවා මේ කතාවේ අගමුල වගේම අභිමන් චරිතයට පණ පොවන සුමිරාන් ධනංජය ගුණසේකර සමඟ සුන්දර කතාබහක් ඔබට ගෙනෙන්න.**



**●ඔබ වෘත්තිය නළුවෙක්ද?**

මම ඇත්තටම වෘත්තිය වශයෙන් ව්‍යාපාරිකයෙක්. මගේ විනෝදාංශය සහ මගේ ආදරය, මගේ නිදහස තමයි රංගනය හා නිවේදනය. අලුත් අවුරුද්දේ තියෙන බලාපොරොත්තුව තමයි මේ සියල්ලම අතරේ හිතේ නිදහසේ ජීවත් වෙන එක. හිතේ නිදහසෙන් ජීවත් වෙන්න වටපිටාව හැදෙනවනම් ඒක තමයි ලොකුම දේ..

**●ඔබ නිවේදන ක්ෂේත්‍රයට සම්බන්ධ වුණේ කොහොමද ?**

මම රංගන ක්ෂේත්‍රයට එන්නෙ 2010දී. ඒ සුළඟ ටෙලි නාට්‍යයෙන්. එහි මම ප්‍රධාන චරිතය කළා ආශා අක්කා එක්ක. ආශා අක්කා, සඳරුවන් අයියා තමයි මාව ක්ෂේත්‍රයට ගේන්නෙ. මාව කලාකාරයෙක් කිරීමේ මුල්ම ගෞරවය හිමි වෙන්න ඕන එයාලට. ඊට පස්සෙ සඳරුවන් අයියා මාව ITN එකේ වැඩසටහන්වලට සම්බන්ධ කර ගන්නවා. නමුත් මම නිවේදකයෙක් විදියට තමයි ඉස්සෙල්ලාම කැමරාවක් ඉස්සරහට යන්නෙ. පාසලේ 11 වසරේ ඉගෙන ගන්නකොට ජාතික රූපවාහිනියේ හැම සෙනසුරාදා, ඉරිදාවකම පැය හතරක සජීවී වැඩසටහනක් කළා සුපිපි තාරකා කියලා. ඒ එක්ස්පීරියන්ස් තමයි මාව කැමරාවක් ඉස්සරහ බය නැති මනුස්සයෙක් සහ දැන් නිවේදකයෙක් විදියට මේ වගේ ස්ටේජ් එකක් උඩ කටයුතු කරන්න පන්නරය ලබලා දුන්නෙ.

**●එතකොට ඔබේ හීනය වුණේ නිවේදකයකු වීමද?**

ඔව්. මගේ හීනය වුනේ නිවේදකයෙක් වෙන්න. මගේ අම්මගේ හීනය වුනේ මාව ඩොක්ටර් කෙනෙක් කරන්න. මම පවුලේ එකම දරුවා. හීන ගොඩක් මැද්දෙ අම්මා මාව හැදුවේ. මම ඒක අතාරිනකොට අම්මට ඕන වුණා මාව නීතිඥයෙක් කරලා ජජ් කෙනෙක් කරන්න. ඒ හීනය යථාර්තයක් කරන්න තමයි මගේ උපාධිය වශයෙන් LLB එක කළේ. හැබැයි ඒක කරලා ඉවර වෙද්දී මට හිතුණා මේක මට හරියන් නෑ කියලා. මම කරන දේ මට ආත්ම තෘප්තියක් නැත්තන් මම ඒක අතහැරලා දානවා. ඒක මගේ හැටි. ඉතින් ක්ෂණිකව ඒකත් මම අතහැරලා දැම්මා. අපේ අම්මා සැහෙන්න දුක් වුණා. ඊට පස්සෙ තමයි මීඩියා, බිස්නස්වලට සම්බන්ධ වුණේ.

**●මේ දිනවල අභිමන්ට ලැබෙන ප්‍රතිචාර කොහොමද ?**

මිනිස්සු මේ දවස්වල අභිමන්ට බණිනවා. ප්‍රතිපත්තියක් නෑ. කොන්දක් නෑ කියලා. හැබැයි එහෙම බැන්නට පාරට බැස්සම තියෙන්නෙ ආදරේ විතරයි. මම හිතනවා අපිට ගන්න පුළුවන් ලොකුම සම්මානය ජනතා සම්මානය කියලා. ජනතා සම්මානය උපරිමය ලැබෙනවා. මම කියන්න ඕනෙ අපේ සම්මානය තමයි ප්‍රේක්ෂකයා. ඔවුන් අපිව ප්‍රතික්ෂේප කරපු දවසට කලාකාරයා පවතින් නෑ. මට ලැබෙන ඒ ආදරය මිල කරන්න බැරි තරම් වටිනවා.

**●සුමති ටෙලි සම්මාන උලෙළෙහි ජනප්‍රිය නළුවන් 20දෙනා අතරට මෙවරත් ඔබ තේරීපත් වෙනවා. එක් අවස්ථාවක ඔබ සමාජ මාධ්‍ය හරහා ජයග්‍රහණයට sms මනාප පළ නොකරන ලෙස ප්‍රේක්ෂකයන්ට කියනවා. ඇත්තටම මොකද්ද ඒ සිදුවීම?**

මම මුලින්ම ජනප්‍රිය නළුවාට නොමිනේට් වෙන්නෙ මගේ සුළඟ නාට්‍යයෙන්. ඊට පස්සෙත් මම නීල පබළු නාට්‍ය රඟපාන කොට අවුරුදු කිහිපයකම නොමිනේට් වෙලා මම එක අවුරුද්දක ජනප්‍රිය නළුවා වෙනවා. මිනිහෙක්ට තියෙන්න ඕන සෑහීමක් කියලා දෙයක් සහ ඕනම දේකින් තෘප්තිය ලබලා ඒ තෘප්තිය අවසන් වෙන්න. අතෘප්තිකර වුනාම තමයි මේ ලෝකෙ ප්‍රශ්න වැඩි. මම එක පාරක් ඒ සම්මානය ගත්තා. ඒ සම්මානයට තේරුණ අනිත් 19දෙනාම මන් හිතනවා මට වැඩිය දක්ෂයි. මට වැඩිය කඩවසම්. නමුත් මම ඒක ගත්තා. ඒකට හේතු දෙකක් තියෙනවා. එක මම හරි වාසනාවන්තයි ඒ සම්මානය ගන්න. මම ඒ සම්මානයට ගරු කරනවා. දෙක ඒ සම්මානය මට ලබා දෙන්න කැම්පේන් කළා සැහෙන පිරිසක්. මම අවංකවම බය නැතුව, දුක නැතුව ලැජ්ජ නැතුව ඒක කියනවා. මගේ පාසලේ මිතුරෝ මම ගියේ රාජකීය විද්‍යාලයට. අපේ තියෙනවා වෙනම නිවේදන සංගම්. ඒ මිතුරන් චැනල් බලන්නෙ නැතුව පක්ෂ පාට භේදයක් නැතුව ඉන්න ඔක්කොමත් මම වෙනුවෙන් sms කළා. මගේ ව්‍යාපාර ලෝකෙ ඉන්න මිතුරෝ මගේ පවුලේ මිනිස්සු මේ හැමෝම කැම්පේන් කලා. මම සල්ලිත් වියදම් කළා ඒ සම්මානය මගේ අතට ගන්න. මට ඕන වුණා ඒ සම්මානය අරගෙන ඒ සතුට මොකද්ද කියලා බලන්න. ඉතින් මම එහෙම කරලා එක පාරක් ඒ සම්මානය ගත්තා. දැන් මන් ඒ ආතල් එක ඒ සතුට විඳලා ඉවරයි. දැන් මට ඒක ඇති. එතැනින් එහාට ඒ සම්මානයේ ආතල් එකක් මට නෑ. ඒක එක හේතුවක් මම මේ සම්මානය එපා කියන්න. දෙවැනි හේතුව අපි ඉන්නෙ මාර අමාරු කාලයක. මගේ ආයතනයට එනවා දවසකට මිනිස්සු විස්සක් තිහක්. මහත්තයො දරුවට පොත් ටික අරන් දෙන්න. දරුවට උදවු කරන්න කියලා. මම සාමාන්‍යයෙන් කරන පින් වැඩ කියන්නෑ. අපි එහෙම මිනිස්සුන්ට උදවු කරනවා. මම කියන්නෙ ඒ සල්ලිවලිනුත් ළමයෙක්ට පොතක් අරන් දෙන්න. මේ කාරණා නිසා තමයි මට මේ සම්මානය එපා කිවුවෙ. මට sms ගහන්න එපා කිව්වෙත්. තව තැනක මම දැක්කා මූ මෙහෙම sms ගහන්න එපා කිවුවට වොයිසි ටීන් එකේදී තරගකරුවන්ට sms ගහන්න කියයි කියලා. ඒක මගේ රස්සාව. රස්සාවේදී මට කියනදේ කරන්න වෙනවා. මම ඒ ආයතනයට බැඳිලා ඉන්නවා. සම්මානයක් කියන්නෙ මගේ ජීවිතේ. ඒක මට එපා කියන්න අයිතියක් තියෙනවා. ඒක පටලවගන්නෙ නැතුව තේරුම් ගත්තොතින් හොඳයි.

**●ඔබේ ආදරණීය කැදැල්ලේ තොරතුරු ටිකකුත් කියමු.**

අපි දෙන්නා විවාහ වෙලා අවුරුදු පහයි. මගේ පුතාට අවුරුදු 3යි. අපි හරි සතුටින් ජීවත් වෙනවා. මම හිතනවා මගේ ජීවිතේ මට වාසනාව ගෙනාවේ මගේ පුතයි බිරියයි කියලා. මම සතුටින් ඉන්නෙත් ඒ දෙන්නා නිසා. මේ හැමදේම කරන්නෙත් ඒ දෙන්නා නිසා. ජීවිතේ හරි පරිපූර්ණයි. හැබැයි මම තව දරුවො හදන එකක් නෑ. මොකද දරුවෙක් වුණත් මාර බැඳීමක්. මම හරි අකැමැතියි බැඳීම් වැඩි කරගෙන දුක වැඩි කර ගන්න. අපි තුන්දෙනත් එක්ක මේ කැදැල්ලේ සතුටින් ජීවත් වෙයි.



**සම්මානයේ ආතල් එකක් මට දැන් නෑ**

**මම හරි අකැමැතියි බැඳීම් වැඩි කරගෙන දුක වැඩි කර ගන්න**

**සම්මානයක් කියන්නෙ මගේ ජීවිතේ ඒක මට එපා කියන්න අයිතියක් තියෙනවා**



**මට ඕන වුණා සම්මානය අරගෙන ඒ සතුට මොකද්ද කියලා බලන්න**






# ජීවන රඟමඬලට සමුදුන් සොඳුරු නාට්‍යවේදියා කේ.බී. හේරත්

► **අනූෂා රණසිංහ**

**ඉස්පිරිතාලේ ලෙඩ්ඩු පණ අදිනවා මිනී පෙට්ටි සාප්පුවට ඇහෙනවා. සාප්පුවේ පෙට්ටිවලට ඇණ ගහනවා ඉස්පිරිතාලෙට ඇහෙනවා.” මේ දෙබස් කාණ්ඩය ඇතුළත් වන්නේ ප්‍රවීණ නාට්‍යවේදී කේ.බී. හේරත් මහතාගේ “මායාදේවි” වේදිකා නාට්‍යය තුළය. විවෘත ආර්ථිකයේ අනාගත අනිටු ප්‍රතිවිපාක තේමාව කොටගත් මෙම වේදිකා නාට්‍යය සර්ව කාලීන නිර්මාණයකි.**

කේ. බී. හේරත් මහතා මෙරට සිටි විශිෂ්ටතම ස්වතන්ත්‍ර නාට්‍ය නිර්මාණ කරුවෙකි. කපුරු බණ්ඩා හේරත් හෙවත් කේ. බී. හේරත් කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් ‘නවගත්ත‘ නම් පිටිසර ගමෙහි ඉපදී, ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකි. ඉන් අනතුරුව 1962 වසරේ දී පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධිය ලබා ගුරුවරයකු ලෙස සිය වෘත්තීය ජීවිතය ඇරඹිය.

1965 වසරේ සිට වසර කිහිපයක් ඉංග්‍රීසි සහ ඉතිහාසය ගුරුවරයෙක් ලෙස ද කටයුතු කළ ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී පාලි මණ්ඩපය, සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ ආරාධිත කථිකාචාර්යවරයකු ලෙසද ටවර් හෝල් නාට්‍ය පාසලේ කථිකාචාර්යවරයකු ලෙසද කටයුතු කරන්නට විය.

ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂවරයකු ලෙසද යොවුන් නාට්‍ය උලෙලේ විනිසුරු මණ්ඩලයේද ජාතික නාට්‍ය මණ්ඩලයේද කේ. බී. කලක් කටයුතු කර ඇත. ඔහු කලාවට සිදු කළ සේවය අගයමින් පසුකාලීනව සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය මඟින් ආචාර්ය උපාධියක්ද පිරිනැමීය.

වේදිකා නාට්‍ය රචනය, නිෂ්පාදනය හා රංග වින්‍යාසය යන ක්ෂේත්‍රවල දැවැන්තයෙකු වූ කේ. බී. හේරත් ක්ෂේත්‍රයට පිවිසෙන්නේ 1979 වසරේදී ප්‍රාදේශීය ශිල්පීන් සමඟ මුලින්ම ‘සුදු කරල්’ වේදිකා නාට්‍යය රචනා කරමිනි. සුදු කරල් නාට්‍යයට පාදක වන්නේ 71 කැරැල්ල හෙවත් තරුණ පරම්පරාවේ ඛේදයයි.

ඉන් අනතුරුව කේ. බී. හේරත් වේදිකාවේ සිය ස්වකීය නිර්මාණ පෞරුෂය විදහා දක්වන්නට විය. ඒ ඔහු 1984 වසරේදී නිර්මාණය කරන ලද ‘මායාදේවි‘ සමඟිනි. 1984 වසරේ ප්‍රේක්ෂක අවධානය දිනා ගන්නට සමත් නාට්‍ය කිහිපයක්ම බිහි වුව ද ඒ සියල්ල අබිබවමින් ‘මායාදේවි‘ නාට්‍යය ප්‍රේක්ෂක අවධානය ලබා ගන්නට සමත් විය.



එපමණක් නොව රාජ්‍ය නාට්‍ය උලෙළේදී නාට්‍ය රචනය, අධ්‍යක්ෂණය ඇතුළු ප්‍රධාන සම්මාන සියල්ලම පාහේ දිනා ගන්නට ද හැකි විය. ඒ නිසාම කේ. බී. හේරත් නාට්‍යවේදියාගේ නාට්‍ය කලා ජීවිතයේ හැරවුම් ලක්ෂ්‍යය ලෙස ‘මායාදේවි‘ හැඳින්විය හැක.

හොඳම වේදිකා නාට්‍යය සුදු කරල් (1979), හොඳම අධ්‍යක්ෂණය මායාදේවි(1985) හොඳම අධ්‍යක්ෂණය නාග ගුරුළා (1992), හොඳම තිර පිටපත දෝන කතිරිනා (1994), හොඳම තිර පිටපත සහ අධ්‍යක්ෂණය දෙවෙනි මහින්ද (1998), හොඳම තිර පිටපත සහ අධ්‍යක්ෂණය වාසුදේව(2002), හොඳම නාට්‍ය පොත යසෝදරා, හොඳම නාට්‍ය පිටපත කළු කුමාරි(2012), හොඳම තිර රචනය හා හොඳම නාට්‍ය ග්‍රන්ථය ලෙස ජගන්මා (2017) සඳහා මොහු සම්මාන ලබා ඇත.

වයඹ ප්‍රසාදිනී, රත්නදීප, ලෝක නාට්‍ය උලෙළ සම්මානය ආදී වේදිකා නාට්‍ය වෙනුවෙන් හිමි සම්මාන පනහකටත් වඩා හිමිකර ගත් කේ. බී. හේරත් 2018 වසරේදී ලංකාවේ නාට්‍යකරුවකුට හිමි වන ඉහළම සම්මානය වන ‘නාට්‍ය කීර්ති සම්මානයෙන් ද පිදුම් ලැබිය.

වේදිකාවට පමණක් සීමා නොවූ ඔහු ටෙලිනාට්‍ය පිටපත් 500ක් පමණ සහ ඒකාංගික නාට්‍ය පිටපත් 200ක් පමණ රචනා කර ඇත. ‘දෝන ඉසෙබෙලා නොහොත් ගජමන් නෝනා, සක්විත්තෝ, ඉසිවර අසපුව, ඉති අතු, ගිරිදෙරණ, සඳගිරි පව්ව, ‘මිහිමඩල ගිනිවදී’, ‘සුවඳ පත්ම’, ‘දෙනුවර මැණිකේ’, දියවඩන මළුව, ටිකිරි නිලමේ, සසර සෙවණැලි ඔහු රචනා කළ ටෙලි නාට්‍ය අතුරින් කිහිපයකි. ඉංගම්මාරුව ඒකාංගික ටෙලි නාට්‍ය මාලාව ඇතුළු ඒකාංගික ටෙලි නාට්‍යද ඔහු රචනා කළේය.

වසන්ත ඔබේසේකරයන්ගේ ‘දොරකඩ මාරාව’ චිත්‍රපටයේ පිටපත රචනා කිරීමටද සහාය වී ඇති කේ.බී. හේරත් ‘සුදු සළු’, ‘අපි මැරෙන්නෙ නෑ’ සිනමා පටයන්වල තිර රචකයාද විය. එමෙන්ම ඔහු විසින් රචිත පිටපත් ගණනාවක් කෘතීන් ලෙස ද පළ කර ඇති අතර එම නාට්‍ය පිටපත් වෙනුවෙන් රාජ්‍ය සාහිත්‍ය සම්මාන ද හිමි වී ඇත.

ඔහු සැමවිටම ස්වාධීන චරිතයක් විය. කිසි කලෙක ඉහළ පැළැන්තියේ ජීවිතයක් ප්‍රිය කළේ ද නැත. බිරිය සහ දියණියන් පස්දෙනා සමඟ ලද දෙයින් සැනසී කොට්ටාව රණසිංහ මාවතේ නිදහස් දිවි පෙවතක් ගත කිරීමට හුරු පුරුදු වී සිටි අයෙකි.

කේ.බී. හේරත් සැමවිටම මානව සමාජය විෂයයෙහි දේශපාලනික විග්‍රහයක් කරන්නට නාට්‍යය සතු ශක්‍යතා භාවිතයට ගත් නාට්‍යකරුවෙකි. එමෙන්ම කේ. බී. හේරත් මුළු හදවතින්ම වේදිකාවට පෙම් බැන්ඳ නාට්‍යයකරුවෙකි. එවන් විශිෂ්ට නිර්මාණ බිහි කළ ප්‍රවීණ නාට්‍යවේදී කේ. බී. හේරත් පසුගිය (29දා) හදිසි රෝගී තත්ත්වයක් හේතුවෙන් ජීවන රඟමඬලට ද සමුදුන්නේය. ඔහු මියයන විට 81 හැවිරිදි වියෙහි පසු විය.

ඔහුගේ අවසන් කටයුතු පසුගිය 30 වනදා බොරැල්ල පොදු සුසාන භූමියේදී සිදුකෙරිණි.

සිය නිර්මාණ තුළින් ලාංකීය සුවහසක් ප්‍රේක්ෂක හදවත් පින වූ කේ. බී. හේරත් මහතා ජනහදවත් තුළ සදා ජීවමානයි !!!





# ශ්‍රී වික්‍රම නූර්තිය නව මුහුණුවරකින් යළිත් වේදිකාවට

▶ නාමලී ගමගේ

**ශ්‍රී ලාංකේය නාට්‍ය කලාවට රූපරාමු වේදිකාවක් රැගෙන ආ පළමු රංගන අත්දැකීම ලෙස නූර්තිය හැඳින්විය හැකිය. වෙනත් නාට්‍ය ශෛලීන්ගෙන් නූර්තිය පැහැදිලිවම වෙන්කර හඳුනාගත හැකි ලක්ෂණ අතර උත්තර භාරතීය රාගධාරී සංගීතය යොදාගැනීම, බබළන රංග වස්ත්‍ර යොදාගැනීම මෙන්ම පසුතල නිර්මාණය සඳහා චිත්‍ර වස්ත්‍ර යොදාගැනීම මූලික වේ. එමෙන්ම පසුතල නිර්මාණයේ දී විශ්මයජනක දර්ශන යොදාගනු ලබන්නේ ද ප්‍රේක්ෂකයාගේ ඇස, කන ආනන්දයෙන් පිනවා සතුටට පත්කර එමඟින් ප්‍රඥාව අවදි කිරීමේ අරමුණ පෙරදැරි කොට ගෙනය.**



බොහෝ ජනාදරයට පත් එවන් රසබර නූර්තියක් ලෙස ශ්‍රී වික්‍රම රාජසිංහ නූර්තිය හැඳින්විය හැකිය. ක්‍රි.ව. 1906 දී නීතිඥ ජෝන් ද සිල්වා සූරීන් විසින් නිර්මාණය කළ සිංහලේ අවසාන රජු ලෙස සැලකෙන ශ්‍රී වික්‍රම රාජසිංහ රජු වටා ගෙතුණු එම නූර්තියේ රජුගේ ගති ලක්ෂණ පිළිබඳ හා අතීතය පිළිබඳව සොයන්නන්හට කුකුසක් මතුවී තිබිණි. එහි සදොස් තැන් ඇතැයි සැකයෙන් මෙරට ඉතිහාසය පිරික්සමින් ගවේෂණයක යෙදුණු වත්මන් ධර්මපාල පරපුරට එවන් තැන් නිදොස් කරමින් එම නූර්තිය ප්‍රතිනිර්මාණය කිරීමේ අවශ්‍යතාවක් මතුවිණි. එහි ප්‍රතිඵලය වූයේ ජෝන් ද සිල්වා සූරීන්ගේ මුල් කෘතිය මූලාශ්‍ර කරගනිමින් රත්නශීලා පෙරේරා විසින් එය නැවත අලුතින් රචනය කිරීමයි. ඇයගේම අධ්‍යක්ෂණයෙන් ධර්මපාල පරපුරේ නිෂ්පාදනයක් ලෙසින් එළිදක්වනු ලබන ශ්‍රී වික්‍රම රාජසිංහ නව නූර්තිය පෙබරවාරි 12 වැනි ඉරිදා සවස 6.00ට මරදාන ටවර් රඟහලේදී වේදිකාගත වීමට නියමිතය. එහි සැබෑ තතු හා අදහස් අප හා බෙදාගත්තේ එහි අධ්‍යක්ෂිකා රත්නශීලා පෙරේරායි.

“වත්මන් ධර්මපාල පරපුර නියෝජනය කරන පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි සහ ආචාර්ය සේනාරත්න සිල්වා මෙරට ඉතිහාසය ගවේෂණය කර සොයා ගන්නවා ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ගැන සමාජගත වෙලා තියෙන්නේ සත්‍ය තොරතුරු නොවන බව. එහි රජු ගැන සඳහන්ව ඇත්තේ ඔහු බේබද්දෙක්, ස්ත්‍රී ලෝලියෙක්, විකාර මතින් තීන්දු තීරණ ගෙන ඇහැලේපොළ පවුල විනාශ කළ චරිතයක් ලෙසින්. නමුත් ධර්මපාල පරපුර සොයා ගන්නවා ඒක එහෙම නොවන බව. රජු පිටුවහල් කළ ඉංග්‍රීසි නැවේ කපිතාන් රජු මත්පැන්වලින් තොර බව ලියා තැබූ සටහන ගැන ඔවුන් සොයාගෙන තිබුණා.

ඒ වගේම එදා ඇහැලේපොළ පවුලේ ඝාතනය සිදුවෙන්නේ ඇහැලේපොළ රාජ ද්‍රෝහියකු වීමේ වරදට, පැවති රාජ්‍ය නීතිය ක්‍රියාත්මක වීම නිසායි. ඊට අමතරව ඉංග්‍රීසීන්ට කත් ඇදපු ඇහැලේපොළ රට පාවා දීම වගේම පිළිමතලාවේ, මොල්ලිගොඩ වැනි නිලමේවරු කුමන්ත්‍රණය කර ඔවුන්ගේ වැරදි යටපත් කරගෙන ඒවා රජුගේ වැරැදි විදිහට පෙන්නා දී රජු පිටුවහල් කිරීමට සැලැස්වීම. එයින් සිදු වුණේ මේවා රජුගේ වැරදි ලෙස ඉස්මතු වීම. ඔවුන් සොයාගත් කරුණු අනුව මේවා රජුගේ වැරදි නොවන බව පැහැදිලි කරමින් මට මෙය නැවත ලිවීමට අන්තර්ගත කරුණු ලබාදෙන්නේ මේ ධර්මපාල පරපුර. ඔවුන්ට තමයි ඕන වෙන්නේ මේ ශ්‍රී වික්‍රම රාජසිංහ නැවත නගාසිටුවන්න. ඔවුන් හිතනවා මෙය රටට ඉදිරිපත් කරන්න හොඳම ආඛ්‍යානය, ක්‍රමවේදය, ශෛලිය මේ නූර්තිය කියලා. සංගීතයෙන් සමීර සුහසිංහ, අංග රචනයෙන් චාමර රාජපක්ෂ, පසුතල නිර්මාණයෙන් කාංචන ගමගේ, රංග වස්ත්‍ර නිර්මාණයෙන් සුජීවා සිරිසේන මෙය වර්ණවත් කිරීමට දායක වුණා.



අධ්‍යක්ෂිකා රත්නශීලා පෙරේරා

නූර්ති කලාව දැන් වියැකී යමින් තියෙන්නේ. ටවර් හෝල් රඟහලේ කාර්යභාරය තමයි මේවා රැකගන්න එක. අවසන් වරට 2000 වසරේ තමයි ජී. එච්. ස්ටැන්ලි පෙරේරා මාස්ටර් සහ වික්ටර් වික්‍රමගේ විසින් නූර්ති කිහිපයක ජවනිකා පමණක් යොදා ගෙන ද පැජන්ට් ඔෆ් ටවර් හෝල් කියලා නිර්මාණයක් කළා. ඒකටත් මම දායක වුණා. සම්පූර්ණ නූර්තියක් බොහෝ කලකින් නිර්මාණය වෙලා නෑ. විශේෂයෙන්ම පාසල්වල උගන්වන ගුරුවරුන්වත් නූර්තියක් දැකලා නෑ. ඒ නිසා ඒ පිළිබඳ ඉගැන්වීමේ දී ඔවුන් අපහසුතාවට පත්වීම සාධාරණයි. පවුලේ ආභාසය නිසා මම පොඩි කාලේ ඉඳන්ම නූර්තිවලට සම්බන්ධවෙලා තියෙනවා. ඒ වගේම ටවර් හෝල් රඟහලට වසර 100ක් පිරීම නිමිත්තෙන් ‘ටවර් හෝල් සියවස් පුරාණය‘ කියලා මම ග්‍රන්ථයක් රචනා කළා. ඒ එක්කම ‘ටවර් හෝල් සුපිරි තරු‘ කියලා එකකුත් රචනා කළා. ඒ දෙකෙන්ම මම කියන්න උත්සාහ කළේ ස්වර්ණමය ටවර් හෝල් යුගය නූර්තියෙන් වර්ණවත් වුණ හැටි. ඒකෙ සම්පූර්ණ විස්තරය දිගහැරෙනවා. හිටපු නළු නිළියන් පිරිස, කරපු නාට්‍ය, ලැබුණු ප්‍රේක්ෂක ප්‍රතිචාර වගේම ටවර් හෝල් සම්ප්‍රදායේ පාලන ක්‍රමවේදය ගැනත් සඳහන් වෙනවා. ඒ වගේම නීතිඥ චාල්ස් ඩයස් සූරීන්ගේ සිවම්මා ධනපාල නූර්තියේ ප්‍රධාන චරිතයටත් මං දායක වුණා. ඒක ලංකාවේ ජනප්‍රියම නූර්තියක්. ඒ අත්දැකීම් සමඟින් මගේ ශාස්ත්‍රවේදී උපාධිය සඳහා විෂයන් හදාරමින්, දැනුම රැස්කරමින් ඒ ගැන ලොකු අවධානයක ඉන්න මොහොතක තමයි මට මේ සඳහා ආරාධනා ලැබෙන්නේ.

1906 වර්ෂයේ නීතිඥ ජෝන් ද සිල්වා සූරීන් නිර්මාණය කළ ශ්‍රී වික්‍රම රාජසිංහ නූර්තිය තමයි පසුකාලීනව වරින් වර වේදිකාගත වෙන්නේ. එහි උත්තර භාරතීය රාගධාරී සංගීතයට අනුව සැකසුණු ගීත අදටත් ජනප්‍රියත්වයේ තියෙනවා.

වාසනා දිනේකි මේක, දන්න වංහුං අප, පිනවන්න සවන් ඇසුවන්ගෙ සොඳින් වගේ ගීත අදටත් ජනප්‍රියයි. නීතිඥ ජෝන් ද සිල්වා සූරීන්ට සංගීතයෙන් සහාය වුණේ ඉන්දියාවෙන් පැමිණි විශ්වනාත් ලව්ජී නමැති බ්‍රාහ්මණ පඬිවරයා. එතුමාගේ නූර්තියේ ඒ ගී තනු යොදාගෙන නූර්ති ලක්ෂණ රැකගනිමින් මාත් මේකට අලුතින් සින්දු ලිවුවා. මේකෙ සම්පූර්ණ ගෞරවය එතුමාට හිමිවිය යුතුයි. මං සලකන විදිහට එතුමා තමයි ශ්‍රී ලාංකේය නාට්‍ය කලාවේ පියා. නූර්ති නාට්‍ය කලාවේ ප්‍රාරම්භකයා සීබන් බස්තියන් සූරීන් ලෙස සැලකුවත් ඔහුගේ නූර්තිවල නිශ්චිත ක්‍රමවේදයක් තිබුණේ නැහැ. ඔහු කළ රොලීනා නාට්‍යයේ නාඩගම් ලක්ෂණ වගේම බටහිර නාට්‍ය ලක්ෂණත් මිශ්‍ර වෙලා තිබුණා. ඊට පස්සේ තමයි එහි අනුප්‍රාප්තිකයා විදිහට නීතිඥ ජෝන් ද සිල්වා සූරීන් නූර්තියට නියම හැඩතල දෙන්නේ.












# මිනිසුන් විවිධාකාරයි කියන එක ගීතයට ලැබෙන ප්‍රතිචාරවලින් මට දැනෙනවා

► අනුෂා රණසිංහ

**දැනුම් තේරුම් ඇති කාලයේ පටන් සංගීත භාණ්ඩවලට ඇලුම් කරනවා වගේම සංගීතය විෂයක් විදියට විශාරද දක්වා හැදෑරූ චතුර සහන් ගුණවර්ධන එතැනින් නොනැවති, තමන්ගේම ගීත කිහිපයක් නිර්මාණය කර ගන්නවා. සහන් ගුණවර්ධන මෙතෙක් ගැයූ ගීත ඔහුගේ YouTube නාළිකාව මඟින් අහන්න දකින්න පුළුවන්. අද මේ කතාබහ චතුර සහන් ගුණවර්ධනගේ අලුත්ම ගීතය වන "සිහින සරුංගල්" ගැන**

**2023 පළවෙනි ගීත නිර්මාණය "සිහින සරුංගල්" ගීතයේ නිර්මාණ පසුබිම ගැන කතා කළොත්?**

මේ සින්දුව මට ලියලා දෙන්නේ මගේ පියා. එක්තරා සිදුවීමක් පසුබිම් කරගෙන කරගෙන මීට මාස හයකට වගේ උඩදී තාත්තා අහම්බෙන් වගේ ලියපු පද පෙළක්. ඒ තුළ අමුතු රැඩිකල් ගතියක් සහ සමාජයේ හැංගිලා කතා කරන තේමාවක් ගැන තිබ්බේ. තාත්තා ලියන විදියට සහ ඒ තුළ තියෙන සාහිත්‍ය රසයට මම ගොඩක් ආසයි. ඒ ඔක්කොම හේතු කරගෙන මම කිවුවා මේකෙන් සින්දුවක් කරමු කියලා. මම ලංකාවේ ෆලෝ කරන කෙනෙක් තමයි නදීක ගුරුගේ අයියා. ඔහු ඒ කාලේ ඉඳන් කරපු නිර්මාණ මම දැකලා තියෙනවා. මම පිටරට ගියත් නදීකා අයියාව තමයි මම ෆලෝ කරේ. ඒ නිසා මේ සිහින සරුංගල් සින්දුව දැනුණු වෙලාවෙත් මම තාත්තට කිවුවේ අපි මේක නදීක අයියාට දෙමු කියලා. නදීක අයියත් මම ආසම කරන විදිහේ මියුසික් කැටගරි එකක් වන ක්ලැසික් රොක් කියන එක තුළින් මේ පද පෙළට සංගීතය මුසුකරලා දුන්නා. ඒ විදිහට තමයි ගීතය නිර්මාණය වුණේ

**● සමාජයේ වෙනත් පැතිකඩක් මේ තුළ තියෙන්නේ, කොහොමද ලැබුණු ප්‍රතිචාර?**

ඇත්තටම මේක අපි රිලීස් කළේ ජනවාරි 31. එදා ඉඳන්ම මම හිතුවේවත් නැති විදිහට ප්‍රතිචාර ලැබුණා. අපි යොදා ගත්ත රූප රාමුවට පවා විවිධ ප්‍රතිචාර ලැබුණා. ඇත්තටම මිනිසුන් කොයි තරම් නම් විවිධාකාරයි ද කියන එක මේ සින්දුව ට ලැබෙන ප්‍රතිචාර තුළින් මට දැනෙනවා. ගොඩක් අය එක එක කෝණ වලින් ගීතය ගැන හිතන්න අරන් තිබුණා. හැමෝම කියන්නේ ලංකාව වගේ රටක් තුළ විවෘතව කතා නොකරන මාතෘකාවක් ඔස්සේ නිර්මාණය වුණු ගීතයක් කියලා. දැන් දැන් තමයි ටිකක් හරි මේ ගැන කතා වෙන්න පටන් ගෙන තියෙන්නේ. ඒකත් එක්තරා විදිහකට මානුෂිය හැඟීමක් සහ හෝමෝන ක්‍රියාකාරිත්වයේ දේවල් නිසා දැනෙන හැඟෙන දෙයක් බව. ඒ නිසා මෙහි එන පද පෙළ සංගීතය සහ ගායනාව වගේම විෂුවල් එක ගැන බොහෝ දෙනා මේ වෙද්දී ප්‍රතිචාර දක්වමින් ඉන්නවා. ලැබෙන ප්‍රතිචාර බොහොමයක් හොඳ ප්‍රතිචාර. ඒ ගැන සතුටක් තියෙනවා.

**සුමුදු සයනේ සිනිඳු සිරුරේ සිතුවමයි**
**වැතිර තෙපලන මිහිරි වදනේ උණුහුමයි**
**නුරා බැල්මෙන් අසංවර සිත චංචලයි**
**ඉවුරු කලතා ඔබේ ආදර රස ගඟයි**

**සිත් සන්තොසින් සපැමිණි**
**සමනල රෑනක සුන්දර දඩයම**
**සඳ සමඟ රමණයෙන්**
**අඳුරු ගොදුරු සොයා ඇදෙයි**

**සිනා සිසී සීසීකඩ**
**සිහින සරුංගල්**
**සැලි සැලී සරසර හඬ**
**නගන සමනලුන්**

**රැදුරු සැඩ සුළි සුළඟ හන්දා**
**සිදු වුණේ ආපසු හැරෙන්නයි**
**වෙනත් මිහිරක් තවත් නොපතමි**
**සිතේ තනිවම දිවි ගෙවන්නයි**

**ගායනය - චතුර සහන් ගුණවර්ධන**
**පද රචනය - ආචාර්ය බන්දුල ගුණවර්ධන**
**සංගීතය - නදීක ගුරුගේ**
**සංගීත සංයෝජනය - මංජුල බණ්ඩාර**

**● මෙහි රූප රචනාව ගැනත් කතා කළොත්?**

රූප රචනාව කරන්නේ මගේ සහෝදරයෙක්. ඔහු තමයි මගේ කලින් ගීත වන "මගේ කියා" සහ "ඔබ නැති ලෝකය" කියන දෙකේම රූප රචනාව කළේ. මේ ගීතය නිර්මාණය වෙද්දී මම ඔහුට තමයි කිවුවේ මෙහෙම වැඩක් තියෙනවා පොඩි ෆිල්ම් වැඩක් කරමු කියලා. එතැනදී ඔහුත් හිටියේ දැන් තියෙන මේ විෂුවල් සම්ප්‍රදායෙන් ටිකක් එළියට ගිහින් වෙනස් විදියේ අලුත් කොලිටි වැඩක් කරමු කියන තැන. ඔහු නමින් දොන් මාධව කරුණානායක. ඔහුත් මගේ ආච්චිගේ ගම වන වග - පහත්ගම කියන ගමේ. ඔහු තමයි මෙම විෂුවල් එකේ පිටපත සහ කාස්ටින් එක කරේ. ඒ සියල්ලටම මම ඔහුට උපරිම නිදහස දුන්නා.

**● සිහින සරුංගල් ඔබේ කීවෙනි ගීතයද?**

මේ හතරවෙනි ගීතය. මුල්ම ගීතය වෙන්නේ සකුන්තලා. ඊට පස්සේ ඔබ නැති ලෝකේ සහ මගේ කියා කියන ගීත දෙක නිර්මාණය වුණා.

**● ඔබ ගායකයෙක් දක්වා පැමිණි ගමන් මඟ ගැන කිවුවොත්?**

මම 2006 දී උසස් පෙළ කරන කාලේ විශාරද විභාගය සමත් වුණා. ගායන සහ වයලින් වාදන කියන දෙඅංශයෙන්ම. මට අවශ්‍ය වෙලා තිබ්බේ සංගීතඥයෙක් වෙන්න. මාව ළඟින් ආශ්‍රය කරපු හැමෝම දන්නවා ඒ. ආර්. රහුමාන් කියන නම මම බිත්තියේ ගහගෙන හිටිය කෙනෙක්. මම ආස කළේ අධ්‍යක්ෂවරයෙක් වෙන්න. නමුත් උසස් පෙළින් පස්සේ ගෙදරින් කැමති වුණේ වාණිජ අංශයෙන් උපාධිය සහ මාස්ටර් එක ලබා ගන්නවට. ඒ නිසා විදෙස්ගතව ඒ පැත්තෙන් ඉගෙනීම් කටයුතු කළා. නැවත ලංකාවට ආවට පස්සේ මට ඕනේ වුණා සංගීතය කරන්න. ඒ අනුව තමයි 2019දී නැවත සංගීත කටයුතු පටන් ගත්තේ. මම අවුරුදු තුනේදී මුකුත් නොතේරෙන වයසේදී ඉන්දියාවේ ගිහින් මුලින්ම අල්ලලා තියෙන්නේ සර්පිනාවක්. ඒක අදටත් මගේ ගාව තියෙනවා. මම ඇත්තටම ආටිස් කෙනෙක් සහ මගේ වෘත්තීය වෙන්නේ කෘෂිකර්මය. මම වගා කරනවා. වගා කරන්නෙත් වස විසෙන් තොරව. 2014දී වගා කරන්න ගත්තේ. කවුරුත් හිතන්නේ නැති පැතිවලින් මම යන්නේ. මම කැමැති මාව ආටිස් කෙනෙක් විදිහට සහ ව්‍යාපාරිකයෙක් විදියට පිළිගන්නවාට. මොකද ඒක තමයි පොඩි කාලේ ඉඳන්ම මගේ එකම බලාපොරොත්තුව.

**● පසුබිම් ගායනයට සම්බන්ධ වෙන්න අවස්ථාවක් ලැබුණද?**


මේ වෙද්දී පුංචි තිරයේ නිර්මාණ දෙකකට පසුබිම් ගායනයෙන් සම්බන්ධ වෙන්න අවස්ථාව ලැබුණා. එකක් ළඟදීම එන්න තියෙන "එහෙම වුණොත්" කියන නාට්‍යය. ඒ වගේම සරත් කොතලාවලගේ චිත්‍රපටයේ පසුබිම් ගායනයට ආරාධනා ලැබිලා තියෙනවා. එය සංගීතවත් කරන්නේ ගයත්‍රී කේමදාස.

**● ජීවිතේ දිහා ආපස්සට හැරිලා බලද්දී මොකද හිතෙන්නේ?**

ජීවිතේ ගැන තෘප්තිමත්. මම නිදහසේ ජීවත් වෙන්න කැමති කෙනෙක්. ඒ නිසයි මෙහෙම ඉන්නේ. මේ ආපු කෙටි ගමන තුළ සහ කරපු දේවල් තුළ නිවිච්ච ගතියක් තියෙනවා. ඒ නිසා ජීවිතේ ගැන සතුටුයි.









# කෝටි ගණන් තෑගි ලැබුණ රාහුල් - ආතියා සුපිරි මංගල්‍යය





▶ ඉන්දික ගමගේ

**ඉන්දියානු ටෙස්ට් ක්‍රිකට් කණ්ඩායමේ උප නායක කන්නවුර් ලෝකේෂ් රාහුල් හෙවත් K. L. රාහුල්ගේ තනිකඩ ඉනිම පසුගිය සතියේදී නිමා වුණා. ඒ ප්‍රවේගකාරී දකුණත් පිතිකරුවා සුරූපී නිළි ආතියා ෂෙට්ටිගේ ආදරය හමුවේ දැවී යාම හේතුවෙනි. ආතියා විසින් කළ ඉල්ලීම තුන්වැනි විනිසුරුවරයා වූ සුනිල් ෂෙට්ටි විසින් එක පයින්ම අනුමත කර තිබුණේ බොලිවුඩය සහ ක්‍රිකට් ක්‍රීඩාව අතර ඇති නෑදෑකම නව වටයකින් අලුත් කරමිනි.**

2014 අවුරුද්දේ සිට ඉන්දියානු ක්‍රිකට් කණ්ඩායමේ නැතුවම බැරි වැඩකාරයෙක් වෙලා ඉන්න රාහුල්ට දැන් වයස අවුරුදු 30ක්. ඉන්දියාව වෙනුවෙන් ක්‍රිකට් ආකෘති තුනේම ශතක වර්තා කළ ඔහුගේ වත්කම ඉන්දියානු රුපියල් කෝටි 75කට වැඩියි කියලයි කියන්නේ. ඉන්දියානු සිනමාවේ සදාකාලික තරුණියා වන සුනිල් ෂෙට්ටි සහ අධ්‍යක්ෂිකා මානා ෂෙට්ටගේ දියණිය වන ආතියාත් රාහුල්ගේ සම වයසෙමයි. 2015 වසරේදී HERO චිත්‍රපටියෙන් රිදී තිරයට පිවිසි ආතියා මේ වෙනකොට සිනමාපට 3ක ප්‍රධාන චරිත නිරූපණය කර අවසන්.

රාහුල් හා ආතියා අතර ආදර කතාව පටන් අරගෙන තියෙන්නේ 2019 ලු. ටික කාලයක් කාටත් කාටත් හොරෙන්ම වැඩි දියුණු වුණු මේ සම්බන්ධෙ මුලින්ම එළිවෙලා තියෙන්නේ වික්‍රම් කියන ආතියගේ ළඟම යාළුවෙක්ගේ ඕනවට වැඩි විහිළුවක් නිසා. INSTAGRAM එකේ ආතියා දාපු ෆොටෝ එකකට වික්‍රම් දාපු එක 'හින්ට්' උත්තරයක් නිසා මේ රහස් ආදර කතාන්දරය ලෝකයට එළි වුණා කියල තමයි කියන්නේ. ටික ටික ඕපාදූප වැඩි වෙන නිසාම අන්තිමට රාහුල් INSTAGRAM එකෙන්ම මේ සම්බන්ධය තහවුරු කරලා තියෙන්නේ දෙන්නා එකට ඉන්න ජායාරූපයක් මුදාහැරලා. රාහුල් ගැන බලාපොරොත්තුවෙන් සිටිය ඉන්දියානු තරුණියන් දහස් ගණනක් අඬවපු ඒ විශේෂ දවස තමයි 2020 ජනවාරි 1.

කෙසේ වුවත් අවුරුදු 3කට පස්සේ මේ දෙන්න හැමෝගෙම ආශිර්වාදෙන් එකට එක් වුණා. ඒ විශේෂ දවසේ සුනිල් ෂෙට්ටි නම් හිටියේ පොළොවට අඟල් කීපයක් උඩින්. ඉන්දියානු ක්‍රිකට් කණ්ඩායමේ අනාගත නායකයාගේ මාමා වෙන්නත් හැමෝටම බැහැනේ. කොහොම වුණත් මේ උත්සවයට ඉන්දියානු ක්‍රිකට් කණ්ඩායමෙන් සහභාගී වෙලා තිබුණේ ඉෂාන්ත් ශර්මා විතරයි. ඉන්දියානු කණ්ඩායමේ අනෙක් ක්‍රීඩකයෝ ඔක්කොම කිවියොත් එක්ක තරගාවලිය නිසා කාර්යබහුල වීම තමයි එයට හේතුව. ආතියාගේ ළඟම මිතුරිය ඩයනා පන්ටි වගේම ජැකී ශරොෆ්ගේ දියණිය ක්‍රිෂ්ණාත්, බොනී කපූර්ගේ දියණිය අනුශ්ලාත් විවාහයේ විශේෂ ආරාධිතයන් අතර කැපී පෙනුණා. එදා දවසේ පාන්දරම සුනිල් ෂෙට්ටිට පළමු ඇමතුම ලැබුණේ අවුරුදු 30 වැඩිය පැරණි මිත්‍රයෙක්ගෙන්. ඒ තමයි 'දිල්වාලේ' සිනමාපටයේ සුනිල්ගේ සහය නළුවා වූ අජේ දේව්ගන්.

විවාහයට ආවේ නැතත් තමන්ගේ සගයාගේ අලුත් ඉනිමට සුබ පතන්න විරාත් කෝලි අමතක කළේ නැහැ. රාහුල් වෙනුවෙන් විරාත් ඉන්දියානු රුපියල් කෝටි 2.17 ක් වුණු BMW වර්ගයේ කාරයක් තෑගී කළේ අනුශ්කාගේ සුබ පැතුම්ද එක්කයි.

රාහුල් ඉන්දියානු කණ්ඩායමට තෝරා ගන්න මුල්වුණු හිටපු නායක මහේන්ද්‍ර සිං දෝණිගේ ත්‍යාගය වුණේ කවසාකි NINJA වර්ගයේ යතුරු පැදියක්. ඒ සුබපැතුමේ වටිනාකම ඉන්දියානු රුපියල් ලක්ෂ 80ක්. සුනිල් ෂෙට්ටි තමන්ගේ දුව වෙනුවෙන් රුපියල් කෝටි 50 වැඩි වටිනාකමක් තියෙන අති සුඛෝපභෝගී නිවසක් තෑගී කළේ මුම්බායේ ධනවතුන් වෙසෙන ප්‍රදේශයෙන්. සුනිල් එක්ක සිනමාපට ගණනාවක රඟපෑ ජැකී ශරොෆ් ආතියාට තෑගී කළේ ලක්ෂ 30 වැඩි වටිනාකමක් ඇති ඔරලෝසුවක්. බෝනි කපූර්ගේ පුත්‍රයා වෙන අර්ජුන් කපූර්ගේ තෑග්ග වුණේ කෝටි 1.5 වටිනා බ්‍රේස්ලට් එකක්. බොලිවුඩයේ හැමෝටම තෑගී දෙන සල්මන් මොකුත්ම දුන්නේ නැද්ද? කෙනෙක්ට එහෙමත් හිතෙන්න පුළුවන්. සල්මන් ආතියා වෙනුවෙන්ම විදේශයෙන් ගෙන්වපු AUDI කාරයේ වටිනාකම ඉන්දියානු රුපියල් කෝටි 1.64ක්ලු.

රාහුල් -ආතියා දෙන්නගේ විවාහයට සහභාගී වුණේ පවුලේ සමීපතමයන් 100 දෙනක් විතරයි. මේ විවාහයේ උත්සවය එළඹෙන IPL තරගාවලියෙන් පස්සේ ජයටම පවත්වන්න සුනිල් ෂෙට්ටි නම් දැන්ම ඉඳන්ම සූදානම් වෙනවා කියලත් ඉන්දියානු මාධ්‍ය වාර්තා කරනවා. මේ වසරේ ඉන්දියාවේ තියෙන දැවැන්තම විවාහ උත්සවයක් වෙන මේ උත්සවයට ලෝකේ නොයෙක් රටවල ක්‍රිකට් ක්‍රීඩකයෝ වගේම, ඉන්දියානු සිනමාවේ දැවන්තයොත් සහභාගී වෙන්න නියමිතයිලු. මිට වැඩිය තෑගී බෝග ගොඩක් එදාට ලැබෙන්නත් නියමිතයි. ඒ විතරක් නෙවෙයි, සමහර විට ඒ වෙනකොට රාහුල් ඉන්දියානු ටෙස්ට් කණ්ඩායමේ නායකයා වෙලා ඉන්නත් බැරි කමක් නැහැ.





# ගොඩක් හොඳ කෙනෙක්ට වුණත් වරදින්න පුළුවන් තැන්



**ඕනම දෙයක් ඕනවට වඩා ඕනෙම නෑ කියලා කතාවට කියනවානේ. වැඩිපුර හිත හොඳ කෙනෙක් වුණාමත් ගොඩක් අවස්ථා වලදී ප්‍රශ්න ඇති වෙන්න පුළුවන්. අපි බලමු ගොඩක් හොඳ කෙනෙක්ට වුණත් ජීවිතේ වරදින්න පුළුවන් තැන් මොනවද කියලා. එතකොට ඔයාටත් පුළුවන් ඒ අවස්ථා මොනවද කියලා දැනගෙන ඒව මඟ ඇරගෙන ජීවිතේ සාර්ථකව කටයුතු කරගෙන යන්න.**

## 1. අනවශ්‍ය ලෙස කැපකිරීම් කිරීම

හැම බැඳීමකම සාර්ථකත්වය රඳා පවතින්නේ දෙදෙනාම එකිනෙකා වෙනුවෙන් කරන කැප කිරීම් මතයි. බැඳීමක් වෙනුවෙන් ආයෝජනය කරන එකම කෙනා ඔයා විතරක් විය යුතු නැහැ. ගොඩක් දෙනෙක් වරද්ද ගන්න තැනක් තමයි මෙතැන. තමන්ගෙ මිත්‍රත්වය හෝ සම්බන්ධය ආරක්ෂා කරගන්න ඔයා ඕනවටත් වඩා මහන්සි වෙනවා ඇති, කැප කිරීම් කරනවා ඇති, ඒ වෙනුවෙන් කාලය ශ්‍රමය සමහර විට මුදල් පවා වියදම් කරනවා ඇති. ඒත් ඔයා කොයි තරම් කැප කිරීම් කළත් අනිත් කෙනා ඒ තරම් දෙයක් කරන්නේ නැති වෙන්න පුළුවන්. අමතක කරන්න එපා ඒකපාර්ශ්වික බැඳීමක් ගොඩක් තාවකාලික බව. ඒ වගේම අවසානයේ දී ඔබට ඉතිරි වන්නේ හිත් රිදීමක් පමණක් බව මතක තියාගන්න.

## 2. ඉක්මනින් සමාව දීම

“වැරදි කිරිම මනුස්ස ගතියක් සමාව දිම දේව ගතියක්“ මේ දේ ඔයා අහලත් ඇති. වරදක් පිළිගැනීම වගේම වැරැද්දකට සමාව දීම මිත්‍රත්වයකදී මෙන්ම සම්බන්ධතාවයකදී හරිම වැදගත් දෙයක්. ඒ වගේම ශක්තිමත් සම්බන්ධතාවයකදී අත්‍යවශ්‍යම දෙයක්. එහෙත් ජීවිතේ සමහර අවස්ථා තියෙනවා එකවර අනිත් කෙනාට සමාව දෙන්න බැරි, නිතරම එකම වැරැද්ද කරන කෙනෙක්ට තවත් අවස්ථාවක් දෙනවා නම් ඒ ගැන හොඳට හිතලා බලන්න ඕන. ඔබ ඉක්මනින් සමාව දෙනවා කියන්නේ ඒ කෙනාට ඒ වරදම නැවත වතාවක් කරන්න හොඳ පිටිවහලක්. මේ නිසා ඔබ කෙනෙක්ට සමාව දෙද්දී මේ ගැනත් හොඳින් හිතා බලන්න අමතක කරන්න එපා.

## 3. නිතර available වීම.

මෙතැනත් බොහෝදෙනෙක් වරද්ද ගන්න තැනක්. ප්‍රේම සම්බන්ධතාවයකදී මෙය බොහෝවිට දකින්න පුළුවන්. නිකමට හිතන්න ඔබ අලුතින් කෙනෙක් එක්ක ප්‍රේම සම්බන්ධයක් පටන් ගත්තා කියලා. නිතරම එයා වෙනුවෙන් කාලය ගත කරන්න පුළුවන් කියලා එයාට දැනෙන්න දෙන්නයි ඔයාට ඕනෑ. හැබැයි ඔයාගෙ වැඩ ඔක්කොම පැත්තකින් තියලා හැමතිස්සෙම එයා වෙනුවෙන් ඉන්න එක සම්බන්ධතාවයකදී අහිතකර විදියට බලපාන්න පුළුවන්. කවුරුත් කැමති නෑ තමන්ටම කියලා අරමුණක් නැති කෙනෙක් එක්ක ජීවත් වෙන්න. ඔයාගේ ජීවිතයේ එකම අරමුණ එයා පමණක් බව එයාට දැනුණොත් ඒ සම්බන්ධතාවය ගැන අනිවාර්යෙන්ම එයා නැවත හිතා බලන්න පුළුවන්. මේ නිසා එයා හිතන්න පුළුවන් ඔයාගේ ජීවිතයට එයාට ඕන ඕන විදිහට බලපෑම් කරන්න පුළුවන් කියලා. ඒ නිසා අනිත් අයට ඔබේ ජීවිතයෙන් අනවශ්‍ය ප්‍රයෝජන ගන්න බැරි විදියට කටයුතු කළොත් ඒක ඔබේ සාර්ථකත්වයට හොඳ රුකුලක්.

## 4. සැකය ඇති වීම

ඕනෑවට වඩා කරුණාවන්ත වෙන එකත් එතරම්ම සුදුසු දෙයක් නෙවෙයි. ඔබ ඕනවට වඩා හොඳ කෙනෙක් කියල පෙන්නන්න උත්සහ කළොත් අනිත් අයට ඒ පිළිබඳ සැකයක් ඇති වෙන්න පුළුවන්. සමහර විට අනිත් අය ඔයා ගැන වැරදියට හිතන්න පුළුවන්. කෙනෙක් මේ තරම් කරුණාවන්ත මෙන්ම හොඳ බව පෙන්නන්නෙ එයාගේ යටි හිතේ වෙනත් අරමුණක් ඇති නිසාවෙන් කියලා හිතන්න පුළුවන්. එයාලව රවට්ටන්න උත්සහ කරනවා කියලා හිතන්න පුළුවන්. ඒ නිසා අනිත් අයට දුක හිතෙයි කියල ඕනවට වඩා හොඳ කරන්න යන්න එපා. ඔයාගේ හිතට අවංක අය එක්ක පමණක් ගනුදෙනු කරන්න හොඳින් මතක තබාගන්න.

## 5. අමනාපකම් ඇති වීම

සම්බන්ධතාවයකදී ඔයත් බලාපොරොත්තු වෙනවා ඇති ඔයාගෙ යාළුවා හෝ සහකරු ඔයා වගේම කැප කිරීම් කරයි කියලා. ඔයා හිතනව එයත් ඔයා වගේම පරාර්ථකාමී හා පරිත්‍යාගශීලී වෙයි කියා. කොටින්ම කිව්වොත් ඔයා මේ සම්බන්ධතාවය ගැන ඕනවට වඩා බලාපොරොත්තු තියාගෙන ඉන්නවා වෙන්න පුළුවන්. ඒත් ඒ හැම වෙලාවෙම අනිත් කෙනා ඔයා බලාපොරොත්තු වෙනවා තරම් කැප කිරීම් කරන්නේ නැති වෙන්න පුළුවන් මෙන්න මේ නිසා අපිට අමනාපකම් ඇති වෙන්න පටන් ගන්නවා. ඉතින් ඔයා අනිත් කෙනා ගැන ඕනවට වඩා බලාපොරොත්තු තියාගන්න යන්න එපා. ඒ වගේම සම්බන්ධතා ගැන වැඩිපුර හීන මවන්න යන්න එපා. හීනවල ජීවත් නොවී යථාර්ථයට මුහුණ දෙන්න මතක තියාගන්න.

## 6. නිතරම සමාව ඉල්ලීම

වැරැද්දකදී වරද පිළිගෙන සමාව ඉල්ලීමත් ඉතාම හොඳ දෙයක්. ඔයා වරදක් නොකළත් සම්බන්ධතාවය ආරක්ෂා කරගන්න ඔයා නිතරම සමාව ඉල්ලනවා වෙන්න පුළුවන්. ඔයාගේ පුංචි අතපසු වීමකදී පවා ඔයා අනිත් කෙනා ගෙන් සමාව ඉල්ලනවා වෙන්න පුළුවන්. හැබැයි ඔයා තේරුම් ගන්න ඕන දෙයක් තමයි හැමදේම ඔයාගේ වරදක් නිසා සිදු නොවන බව. මෙහෙම අනවශ්‍ය විදිහට සමාව ඉල්ලන්න ගියොත් ඒ අයට ඔබේ වචනය වැඩක් නැති වේවි. ඒ නිසා හොඳින් මතක තියාගන්න ඔයාගේ වැරැද්දක් නම් විතරක් එයට සමාව ඉල්ලන්න.

## 7. දුර්වල සම්බන්ධතා

වැඩිපුර හොඳ අයට සම්බන්ධතා ඇති කර ගැනීමේදී විවිධ ප්‍රශ්න ඇති වෙන්න පුළුවන්. මේ ගැටලුවට ප්‍රධානම හේතුව තමයි තමන්ගේ අදහස් කෙළින්ම අනිත් කෙනාට කියන්න දක්වන අකමැත්ත හෙවත් මැලිකම. හොඳ සම්බන්ධතාවයක් පවත්වා ගන්න නම් ඔබේ අදහස් අනිත් කෙනා සමඟ විවෘතව බෙදා ගත යුතුමයි. අනිත් කෙනාගෙ හිත රිදෙයි කියලා ඇත්ත දේ සඟවන්න ගියොත් ඔබේ සම්බන්ධතාවය කෙටි කාලීන සම්බන්ධතාවයක් බවට පරිවර්තනය වේවි. හේතුව තමා බැඳීමක ශක්තිමත් බව තීරණය වන්නේ සඟවන්නේ නැතිව අවංකව අදහස්, සිතිවිලි හා හැඟීම් අනිත් කෙනා මත හුවමාරු කර ගැනීමෙන් පමණක් බවයි.

## 8. ඔබ ඔබවම නොසලකා හැරීම.

ගොඩක් හිත හොඳ කෙනෙක් සම්බන්ධතාවයකදී තමන්ට ප්‍රමුඛස්ථානය ලබා දෙන්නෙ නෑ. මොවුන් අවධානය දෙන්නෙ අනිත් කෙනා ගැන විතරමයි. බොහෝවිට තමන්ගේ සතුට අමතක කරලා අනිත් කෙනාගෙ සතුට පමණක් ගැන ඔවුන් හිතනවා. එහෙත් ඔබ හොඳින් මතක තියා ගත යුතු දෙයක් තමයි ඔබේ යාළුවා හෝ සහකරු ගැන හිතනවා වගේම ඔබේ සතුට ගැනත් හොඳින් සිතිය යුතු බව.


**අන්තර්ජාලය ඇසුරින්**







# ඔහු කෝටිපතියෙක් නෙමෙයි ඔහුත් මම වගේ සාමාන්‍ය කෙනෙක්



මහේන් මට උදවු කරයි ඒ විශ්වාසය මට තියෙනවා

► හර්ෂණී වීරරත්න

**හර්ෂි රසංගා කියන්නේ මේ දවස්වල බොහෝ සෙයින් කතාබහට ලක් වූ යුවතියක්. අවුරුදු විස්සක මේ පුංචි කෙල්ල තම වයසට වඩා මුහුකුරා ගිය වචන හැසිරවීම හා ඇගේ විලාසිතා නිසා තමයි කතාබහට ලක් වෙන්නේ. සුජාතා ටෙලි නාට්‍යයේ ළමා චරිතයකට පණ පෙවූ ඈ පසුගිය කාලයේ ළංවී කියන නාට්‍යයෙනුත් දකින්න ලැබුණා. ඇය පසුගියදා විවාහ ගිවිස ගත්තා. ඒ ගුවන් සේවයේ නියුතු තරුණයෙක් එක්ක. විවාහ ගිවිස ගැනිමත් එක්ක සම්පුර්ණයෙන්ම රංගනයට සමු දුන් ඈ විදෙස් ගත වෙනවා කියලා ආරංචියි. හර්ෂිගේ අලුත්ම තොරතුරු දැන ගන්න ඇය වෙනුවෙන් අපි ඉඩක් වෙන් කළා.**

**●හර්ෂී ජීවිතේ අලුත් පිටුවක් පෙරළුවා, මේ පුංචි වයසට පවුල් ජීවිතයක් කියන එක බර වැඩි නැද්ද ..?**

පහුගිය කාලේ බොහෝ දෙනෙක් කිව්වනේ මම මගේ වයසටත් වඩා මුහුකුරා ගිහින් කියලා. ඒ කතාව ඇත්ත. මම පුංචි වයසින්ම ජීවිතේ ගැන වෙනස්ම විදිහට හිතන්න වැඩ කරන්න පුරුදු වුණු කෙනෙක්. විවාහ ගිවස ගත්තේ ඒ ගැන දැනගෙන හා මට එයා එක්ක එකට ජීවත් වෙන්න පුළුවන් කියන හැඟීම දැනුණු නිසයි. එයා මට වඩා අවුරුදු හයක් වැඩිමහල්. ඒ නිසා මම හිටියා වගේම තව කෙනෙක් එක්ක ජීවිතේ බෙදා ගන්න එක කරන්නේ. ඒ ජීවිතේ බර නැහැ. ජීවිතේ බර වෙන්නේ මම තනියම ඔක්කොම බර ඇද්දොත් තමයි. මහේන් මට උදවු කරයි. ඒ විශ්වාසය මට තියෙනවා. ඒ නිසා ජීවිතේ තවම සැහැල්ලුයි.



**●ඔහුගේ පළමු මැසේජ් එකෙන්ම ඔබට ඔහුව හුරු බව දැනෙනවා..?**

ඒක හරි පුදුමයි. මහේන් අනුරාධ තමයි එයාගේ නම. එයා ඉන්ස්ටර්ග්‍රෑම් මාව ෆලෝ කරනවා. මම අහසට ආදරේ කරන කෙනෙක්. නිතරම වගේ අහස ගැන ස්ටෝරිස් දානවා. දවසක් එයා මම දැම්ම අහස ස්ටෝරි එකකට ප්‍රතිචාර දක්වලා තිබ්බා. හරි වෙනස් විදිහට. ඒ නිසා මම එයාගේ ප්‍රොෆයිල් එක බැලුවා. එයා මට මැසෙජ් කරා. ඒක හරි හුරු පුරුදු ගතියක් දැනුණා. ඒ මැසේජ් එක කතාබහ දක්වා දුරදිග ගියා. කැමැත්ත ඇහුවා.. මම කිව්වා ගෙදර ඇවිත් අහන්න කියලා. අපේ ගෙදරින් එයාට කැමැත්ත දුන්නා. ඊට පස්සේ තමයි අපි දෙන්නා ආදරේ කරන්න පටන් ගන්නේ. අවුරුදු එකහමාරක් විතර ආදරේ කරා.

**●ඔබ නිළියක් බව ඔහු දැනගෙන ද ආශ්‍රය කළේ..?**

මම නිළියක් කියලා එයා මුල ඉඳලා දන්නවා. නමුත් නාට්‍ය බලලා තිබ්බේ නැහැ.

**●ආදරේ නිසා ආදරෙන් වැලඳ ගත් නිළිකමත් අහිමි වෙනවා නේද ..?**

ගොඩක් අය කියන්නේ මම රංගනයෙන් ඈත් වෙන්නේ එයා නිසා කියලා. එයා අදටත් මට කියලා නැහැ රඟපාන්න එපා කියලා. මේක මගේ තීරණයක්. මම උසස් පෙළ කළේ නැහැ විදෙස් අධ්‍යාපනය ලබන අරමුණින්. නමුත් ඒ කාලේ ළංවී නාට්‍යයේ වැඩ. විදෙස්ගත වෙන එක කල් දැම්මේ ඒ නාට්‍ය නිසා. දැන් ඒකේ වැඩ ඉවරයි. ඉක්මනින් විවාහ ගිවිස ගත්තේ මහේන් එක්ක කටාර් යන්නයි. එහේ ගිහිං වැඩිදුර ඉගෙන ගන්නවා. ඊට පස්සේ අවුරුදු දෙක තුනකට පස්සේ වෙඩින් එක ගන්න ඉන්නේ. ඒ වගේම කියන්න ඕන මම අන්තිම කාලේ නිළිකම නිසා කළකිරීමකට ලක් වුණා. ඒකත් රටින් යන්න හේතුවක් වෙන්න පුළුවන්

**●ඔහු කෝටිපතියෙක්ලු..?**

අනේ නැහැ. ඔහුත් මම වගේ සාමාන්‍ය කෙනෙක්. ඔහු කෝටිපතියෙක් නෙමෙයි. ඒ කතාව සම්පූර්ණයෙන්ම බොරුවක්.



ඉක්මනින් විවාහ ගිවිස ගත්තේ මහේන් එක්ක කටාර් යන්නයි

**●ඔබේ විලාසිතාවලටත් ඇතැමුන් කතා කියනවා, මහේන්ගෙන් ඔබේ විලාසිතාවලට බාධාවක් නැද්ද ..?**

මම හරි ආසයි විලාසිතා කරන්. ඒ නිසා මම කරනවා. එයා හරි ආසයි මම ලස්සනට අඳිනවට. අකමැති නැහැ.

**●ඔබ ප්‍රසිද්ධියේ කන්‍යාභාවය ගැන කතා කරලා චෝදනාවට ලක් වුණා. ඔබේ මවුපියන් බය වුණේ නැද්ද ඔබ ගැන ..?**

මාව හොඳටම දන්නේ එයාලා. හැමෝටම පොදු දෙයක් මම කතා කරාම මොකද වෙන්නේ. මට නම් ඒක සාමාන්‍ය දෙයක්. මගේ අම්මා තාත්තා වුණත් සංස්කෘතිය කියලා ඒක මත්තේ ජීවත් වෙන දෙන්නෙක් නෙමෙයි. සංස්කෘතික දේවල්වලට ගරු කරනවා. මම විවාහ වෙනවට එයාලා කැමති වුණෙත් මම ගැන බයක් නැති නිසයි.



**●කලාවෙන් සම්පූර්ණයෙන්ම අයින් වෙන්නද කල්පනාව..?**

නැහැ. රංගනයෙන් අයින් වුණාට මම ගායනය පැත්තට එනවා. අලුත් ගීත දෙකක් මේ දවස්වල කරමින් ඉන්නවා. ඒවා එළිදක්වනවා. ඒ වගේම මම කරපු නාට්‍ය කිහිපයක් එන්නත් තියෙනවා. මම නැති වුණාට ඒක දැනෙන්නේ නැති වෙයි. ඒ වගේම රසික ප්‍රතිචාර ගැන සතුටුයි. ඒ ප්‍රතිචාර ලබන්න ලංකාවේ ඉන්න නැති එක ගැන නම් දුකයි. වෙන කිසි දෙයක් ගැන මම දුක් වෙන්නේ නැහැ.

වර්ෂ 2023ක් වූ පෙබරවාරි මස 5 වැනිදා ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.